# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)

## 10 ශ්‍රේණිය




සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

# 10 වැනි ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපෑල :info@nie.lk*

**සංස්කෘත භාෂාව**

**ගුරු මාර්ගෝපදේශය**

**10 වැනි ශ්‍රේණිය**

**ප්‍රථම මුද්‍රණය - 2015**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*
*විද්‍යුත් තැපැල :info@nie.lk*

මුද්‍රණය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ලෝකයේ තිබෙන සම්භාව්‍ය භාෂා අතරින් අද්විතීය ස්ථානයක් හිමි කරගෙන ඇති සංස්කෘත භාෂාව, යුරෝපයේ හා ආසියාවේ භාෂා බහුතරයක මූල භාෂාව ලෙස ද සැලකේ. සිංහල භාෂාවේ ඇති වචන අතරින් සියයට අනුවක් පමණ සංස්කෘත තත්සම හා තද්භව වචන යි. එබැවින් ලෝකයේ කවරකුටවත් වඩා සංස්කෘත භාෂාව ඉගෙනීම වැදගත් වන්නේ ශ්‍රී ලංකිකයන්ට ම ය. මනා පෞරුෂයකින් හෙබි සදාචාර සම්පන්න පූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ය. ඒ නිසා පාසල තුළ සංස්කෘත භාෂාව විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කිරීම සඳහා නව ඉගැන්වීම් ප්‍රවේශ ඇතුළත් කොට නිපුණතා පාදක ව මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කොට ඇත.

ගුරු මාර්ගෝපදේශයක ඇතුළත් කරන තොරතුරුවලින් සමස්ත වශයෙන් අපේක්ෂා කරනුයේ ගුරු භවතුන්ට තම ඉගැන්වීම් කාර්යයේ දී යොදා ගත හැකි මූලික උපදෙස් ලබා දීම හා ඔවුන් වඩාත් ඉහළ නිර්මාණාත්මක ප්‍රවේශ කරා යොමු කිරීම යි. පන්ති කාමර කටයුතුවල දී මෙම ගුරු මාර්ගෝපදේශය එම පදනමින් පරිශීලනය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

සුවිශේෂ ලෙස සැලකුව හොත් ගුරු උපදෙස් සංග්‍රහය, ශිෂ්‍ය කේන්ද්‍රීය ලෙස පන්ති කාමරයේ කටයුතු සංවිධානය කළ යුතු ආකාරය පිළිබඳ මඟ පෙන්වීමකි. ශිෂ්‍ය කේන්ද්‍රීය ලෙස ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම ගුරු භවතුන්ට අලුත් අත්දැකීමක් නොවුව ද, නිපුණතා පාදක නව ප්‍රවේශය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදයට අලුත් මුහුණුවරක් දී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය, පාඩම් සැලසුම් කොට, ශිෂ්‍ය සහභාගිත්වය ඇති ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්නුම් කරන අතර, ඒ සඳහා සුදුසු පරිසරය ද මැනවින් ගොඩ නගයි. නව සහස්‍රකය අලුත් අත්දැකීම් උත්පාදනය වන යුගයක් බැවින් සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට හිර නො වී භාෂාව ඉගැන්වීමේ නව ක්‍රම ගැන සිතන්නට ගුරු භවතුන් යොමු වීම කාලීන අවශ්‍යතාවකි. ඒ අනුව ගුරුවරයා දැනුම් සම්ප්‍රේෂකයකු නො ව දැනුම් උත්පාදකයකු විය යුතු යි.

සංගීත, නැටුම්, චිත්‍ර, මූර්ති, කාව්‍ය ශාස්ත්‍ර, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග අත්‍යන්ත බැඳීමක් ඇති සංස්කෘත භාෂාව හදාරා, ශ්‍රී ලාංකික සිසු පරපුර අනාගත ලෝකයේ ශ්‍රේෂ්ඨ පුරවැසියන් බවට පත් කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශය යොදා ගනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

10 ශ්‍රේණියේ සංස්කෘත භාෂා ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීම සඳහා සහභාගී වී දායකත්වය දැක්වූ ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥ පිරිසටත් බාහිර සම්පත් දායක පිරිසටත් මගේ ස්තුතිය පිරිනමමි.

**මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**වෙබ් අඩවිය :** www.nie.lk
**විද්‍යුත් තැපැල:** info@nie.lk

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

2015 වර්ෂයේ විෂයමාලා ප්‍රතිසංවිධානය යටතේ විදේශ හා සම්භාව්‍ය භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදීමට ලැබීම ඉතා සතුටට කරුණකි. වර්තමානයේ දී, ජාත්‍යන්තරය සහ ගෝලීයකරණය තුළ විදේශ භාෂා සඳහා හිමි වන්නේ සුවිශේෂ වැදගත්කමකි. විවිධ සමාජ මට්ටම් තුළ විවිධ භාෂාවල භාවිතය, ඉතා සීමිත භාෂා කිහිපයක පවත්නා භාෂාත්මක අධිරාජ්‍යවාදය මුලිනුපුටා දමයි.

වර්තමානයේ දී, ශ්‍රී ලාංකිකයන් තුළ භාෂා ඉගෙන ගැනීම සඳහා ඉතා විශාල ඉල්ලුමක් සහ උනන්දුවක් පවතියි. 2015 වර්ෂයේ දී චීන, රුසියන් සහ කොරියන් යන භාෂා ද සාමාන්‍ය පෙළ විෂයමාලාවට ඇතුළත් වී ඇති හෙයින් ශිෂ්‍යයන්ට ජපන්, ජර්මන්, ප්‍රංශ, හින්දී, පාලි, සංස්කෘත සහ අරාබි යන විෂයයන්ට අමතර ව ඉහත භාෂා ද හැදෑරීමේ අවස්ථාව උදාවනු ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයේ සඳහන් එක් එක් නිපුණතාවන් අත්පත් කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව ගුරුවරයාට මග පෙන්වීමක් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුව වඩා හොඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා දායකත්වය ලබාදුන් බාහිර සම්පත් පුද්ගල කණ්ඩායමට ද මෙම පොත සකස් කිරීමේ වගකීම දැරූ ව්‍යාපෘති නායක සහ ඒ සඳහා සහාය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය හිමි වේ.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය විශේෂඥ උපදේශනය** - මහාචාර්ය වෝල්ටර් මාරසිංහ
(සංස්කෘත විෂය පිළිබඳ ජෝෂ්ඨ මහාචාර්ය)

**විෂය සම්බන්ධීකරණය** - රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි.
සහකාර කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය,

**ලේඛක මණ්ඩලය** -

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය**

01. පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (සහකාර කථිකාචාර්ය)
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, (විශිෂ්ට පන්ති)
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (විශිෂ්ට පන්ති)
පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති )

**බාහිර ලේඛක මණ්ඩලය**

02. මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත විෂය පිළිබඳ මහාචාර්ය

03 පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සංස්කෘත විෂය උපදේශක)
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,)

04 පූජ්‍ය විදුරුපොල ආනන්ද හිමි (පරිවේණාචාර්ය)
(රාජකීය පණ්ඩිත, ගෞරව ශාස්ත්‍රවේදී, පශ්චාද් උපාධි
අධ්‍යාපන ඩිප්ලෝමා,)

05 පූජ්‍ය අබේසේකරගම විජිත හිමි (නියෝජ්‍ය පරිවේණාධිපති)
( ගෞරව ශාස්ත්‍රවේදී, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,)

**විෂය සංස්කරණය** - මහාචාර්ය වෝල්ටර් මාරසිංහ
(සංස්කෘත විෂය පිළිබඳ ජෝෂ්ඨ මහාචාර්ය)

**භාෂා සංස්කරණය** - රාජකීය පණ්ඩිත, ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි.
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය, යක්කල.

**යතුරු ලියනය** - පූජ්‍ය අබේසේකරගම විජිත හිමි (නියෝජ්‍ය පරිවේණාධිපති)
(ගෞරව ශාස්ත්‍රවේදී, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,)
ශ්‍රී රේවත විද්‍යායතන පිරිවෙණ, කුඹල්වැල්ල, ගාල්ල.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතර සංස්කෘත භාෂාවට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. සිංහල භාෂාවේ බහුතර වචන සංඛ්‍යාවක් සකස් වී ඇත්තේ සංස්කෘත තත්සම හෝ තද්භව වචනවලිනි. ඒ අනුව සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බිහි කිරීමේ ශක්තිය සංස්කෘත භාෂාවට ඇත. එහෙයින් පාසල්වල සංස්කෘත භාෂාව විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු අතර, ඒ තුළින් සිසුන්ගේ සිංහල භාෂා දැනුම ද ඉබේ ම ඉහළ මට්ටමකට පත් වනු ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඔස්සේ නිපුණතා පාදක විෂයමාලාවක් පාසල් පද්ධතියට හඳුන්වා දී ඇත. ඒ අනුව 10 ශ්‍රේණියේ සංස්කෘත විෂය නිර්දේශය ද, නිපුණතා පාදක ව සකස් කර ඇත. ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී සිදු වේ. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය වනුයේ සිසු විභවතා මතු කර ගැනීමට සමත් උද්‍යෝගිමත් ගුරු භූමිකාවක් නිර්මාණය කිරීම පිණිස ය. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු අත්පොත නිර්මාණය කොට ඇත. එහි දී විෂය භාර ගුරු භවතා විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධාය යොමු කොට ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදිය යුතු වේ.

10 ශ්‍රේණිය සඳහා නිපුණතා අටක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් කොට ඇත. නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැළකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමු කොට, අපේක්ෂිත ඉගෙනුම් පල, පාඩම් අවසානයේ දී ශිෂ්‍යයා තුළින් ප්‍රකට වන පරිදි, ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශයෙහි සෑම නිපුණතාවකට ම යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුභවතාට මෙහි දී නිදහස හිමි වේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැළකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි නිපුණතාවලට වෙන් කර ඇති කාලච්ඡේද ප්‍රමාණ සංශෝධනය කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. එසේ ම බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එක විට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන බැවින්, ඊට සුදුසු පරිදි පාඩම කළමනාකරණය කර ගැනීම ද ගුරුවරයා සතු වගකීමකි.

පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද යොදාගැනීම මෙහි දී යෝග්‍ය වන අතර තාක්ෂණික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගත යුතු ය. එහි දී ගුණාත්මක යෙදවුම් ලෙස සංයුක්ත තැටි, බහු ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක, චලන රූප, පැනල් පුවරු ආදිය භාවිත කළ හැකි ය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ව සිදු වන්නේ දැයි සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් වන අතර එහි දී තක්සේරුව හා ඇගයීම ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. එ මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යොන්‍ය සබඳතාව තහවුරු වේ. එසේ ම ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරුව හා ඇගයීම හොඳින් කියවා අවබෝධ කරගෙන, ඒ අනුව වාරයකට ඇගයීම් ආධාරක දෙක බැගින් සකසා සිසු සාධනය ඇගයීමට ලක් කළ යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී, ඉගෙනුම් පල අත්පත් කරගත යුතු අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණාත්මක ව සිදුකරගත යුතු ය.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි.
ව්‍යාපෘති ප්‍රධාන

# පටුන


| | පිටු අංකය |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| පටුන | viii |
| විෂය නිර්දේශය | ix |
| ජාතික අරමුණු | x |
| මූලික නිපුණතා | xi |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xiii |
| විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම | xiv |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xix |
| තක්සේරුව හා ඇගයීම | xx |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | xxi |
| නිපුණතාව 01 | 1 |
| නිපුණතාව 02 | 6 |
| නිපුණතාව 03 | 8 |
| නිපුණතාව 04 | 13 |
| නිපුණතාව 05 | 16 |
| නිපුණතාව 06 | 20 |
| නිපුණතාව 07 | 24 |
| නිපුණතාව 08 | 26 |
| තක්සේරුව හා ඇගයීම - හැඳින්වීම | 31 |
| ඒ ඒ වාර සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙල (නිපුණතා මට්ටම අනුව) | 32 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 33 |

# 10 ශ්‍රේණිය

# සංස්කෘත

## විෂය නිර්දේශය

## 01 විෂය හැඳින්වීම

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම, කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දී, ගුජරාටී, මාරාටී ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරැදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙන-ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම්, ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමී ආදීන් ලෝපතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එබස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැයි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළ බසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර, එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැයි සම්මත විද්‍යානිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්. කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රීලාංකිකයන් වන අපට ය. එබස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ව ඇත. විශේෂයෙන් විදුහල්පතිවරු සිය පාසල්වල අ. පො. ස. (සා/පෙළ) සිට හෝ සංස්කෘතය ඉගැන්වීමට පියවර ගන්නෝ නම්, සිසුන්ගේ සිංහල දැනුම ද ඉබේ ම ඉහළ මට්ටමකට පත් වනු ඇත.

# 02 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I　මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II　වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III　මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV　පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V　සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI　පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII　ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII　ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම　2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 03 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම, සහ
ව්‍යාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම.

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 04 විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණ මාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යොතිර්විද්‍යාව, නක්‍ෂත්‍රශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුශලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. හින්දු ස්තෝත්‍ර -හා බෞද්ධ සංස්කෘත ශ්ලෝක, සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති බැවින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම

## සංස්කෘත විෂය

### විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 10 | I | 1.1, 1.2, 1.3, 1.4, 1.5, 2.1, 2.2, 2.3, 3.1, 3.2, 3.3, 3.4, | 30 |
| | II | 3.4, 3.5, 4.1, 4.2, 4.3, 5.1, 5.2, 5.3 | 30 |
| | III | 5.3, 6.1, 6.2, 6.3, 7.1, 7.2, 7.3, 7.4, 8.1, 8.2 | 30 |
| | | එකතුව | 90 |

# 05 සංස්කෘත විෂය නිර්දේශය - 2015

## 10 ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. සංස්කෘත අක්ෂර මාලාව නිවැරැදි ව කියැවීමට හා ලිවීමට හැකියාව ලබයි. | 1.1 දේවනාගරි අක්ෂර මාලාව නිවැරැදි ව කියවයි.<br><br>1.2 දේවනාගරි අක්ෂර මාලාව නිවැරැදි ව ලියයි.<br><br>1.3 ව්‍යඤ්ජනාක්ෂරයන්ට ස්වර ආරෝපණය කොට ලියයි; කියයි.<br><br>1.4 සරල සංයුක්තාක්ෂර නිවැරැදි ව කියයි; නිවැරැදි ව ලියයි.<br><br>1.5 දේවනාගරී අක්ෂරයෙන් ලියූ සරල වචන කියවයි. | ▪ දේවනාගරී අක්ෂර ලිවීම<br><br>▪ ව්‍යඤ්ජනයන්ට ස්වර ආරෝපණය කොට දැක්වීම<br><br>▪ සරල සංයුක්තාක්ෂර ලිවීම හා කියැවීම<br><br>▪ දේවනාගරී අක්ෂර සහිත වචන ලිවීම හා කියැවීම. | • ස්වර අක්ෂර මාලාව හඳුනාගෙන භාවිත කරයි.<br>• දේවනාගරී අක්ෂර ලියන පියවර හඳුනාගෙන භාවිත කරයි.<br><br>• ස්වර අක්ෂර මාලාව හ්‍රස්ව - දීර්ඝ වශයෙන් ප්‍රභේදගත කරයි.<br>ව්‍යඤ්ජන - වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර හා ඌෂ්මාක්ෂර යනුවෙන් වර්ග තුනකට බෙදෙන බව ප්‍රකාශ කරයි.<br>• ස්වර මෙන් ම ව්‍යඤ්ජන පියවර කීපයකින් ලියැවෙන බව පෙන්වා දෙයි.<br>ඇතැම් ව්‍යඤ්ජනවලට ස්වර ආරෝපණය කොට පිලි යෙදීමේ දී ඇති විශේෂතා හඳුනාගෙන භාවිත කරයි.<br>නිවැරැදි ව පිලි යොදා වචන ලිවීමේ හැකියාව ලබයි.<br>• සංයුක්තාක්ෂර හඳුනාගෙන නිවැරැදි ව භාවිත කිරීමේ හැකියාව ලබයි.<br>• සංයුක්තාක්ෂර සහිත ඡේද කියවීමේ හැකියාව ලබයි. | 12 |
| 02. වචන භේදය හා ලිංග භේදය පිළිබඳ වත්, මාධ්‍ය භාෂාවේ වචන භේදය, ලිංග භේදය අතර ඇති වෙනස්කම් පිළිබඳ වත් අවබෝධ කරගැනීමේ හැකියාව ලබයි. | 2.1 ඒකවචන, ද්විවචන, බහුවචන භේදය හඳුන්වයි<br><br>2.2 මාධ්‍ය භාෂාවේ ලිංග භේදයෙන් සංස්කෘත භාෂාවේ ලිංග භේදය වෙනස් වන අයුරු හඳුනාගනියි.<br><br>2.3 ලිංග භේදය අනුව ඒ ඒ නාමපදයන් හා වචන භේදයන් වටහාගනියි. | ▪ සංස්කෘත භාෂාවේ හා මාධ්‍ය භාෂාවේ වචනවල ලිංග භේදයෙහි ඇති විශේෂතා පිළිබඳ පැහැදිලි කිරීම.<br><br>▪ සංස්කෘත භාෂාවේ හා මාධ්‍ය භාෂවේ ලිංග භේදයෙහි ඇති විශේෂතා පැහැදිලි කිරීම. | • නාමපදවල වචනත්‍රයක් ඇති බව අවබෝධ කරගෙන භාවිත කරයි.<br>සංස්කෘත භාෂාවේ ක්‍රියාපදවල ද වචනත්‍රයක් ඇති බව පැහැදිලි කරයි.<br>• මාධ්‍ය භාෂාවෙන් ඒවාට අර්ථ දක්වයි.<br>• සංස්කෘත භාෂාවේ හා මාතෘ භාෂාවේ ලිංග භේදයන් අතර ඇති වෙනස පෙන්වා දෙයි.<br>• ලිංග අනුව ක්‍රියාපදය වෙනස් නොවන බව අවබෝධ කරගෙන කියයි.<br>• පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග පද වෙන් වෙන් ව ප්‍රකාශ කරයි. | 08 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03. සරල වාක්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ලබයි. | 3.1 නාමයක් විභක්ති ගන්වන අයුරු වටහාගනියි.<br>3.2 විභක්තිගත නාමයක විභක්ත්‍යර්ථය නිවැරැදි ව ප්‍රකාශ කරයි.<br>3.3 ප්‍රථමා, ද්විතීයා, තෘතීයා විභක්ති හඳුනාගනියි.<br>3.4 ලට්, ලඞ්, යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරැදි ව වරනගයි. | ▪ විභක්ති යනු කුමක් දැයි පැහැදිලි කරදීම<br>▪ අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත පුල්ලිංග හා ආකාරාන්ත, ඉකාරන්ත, උකාරාන්ත ස්ත්‍රී ලිංග ශබ්දවල ප්‍රථමා, ද්විතීයා, තෘතීයා විභක්තිත්‍රය ඉගැන්වීම.<br>▪ ලට්, ලඞ් ලකාරවල පරස්මෛපද ප්‍රත්‍යය හා වරනැගීම් හඳුන්වාදීම.<br>▪ 1, 4, 6, 10 ධාතු ගණ ලට්, ලඞ්හි වරනැගීම.<br>▪ භූවාදි ධාතු ගණය<br>▪ දිවාදි ධාතු ගණය<br>▪ තුදාදී ධාතු ගණය<br>▪ චුරාදි ධාතු ගණය | • නාම හා නාමපද අතර ඇති වෙනස පැහැදිලි කරයි.<br>• ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා, තෘතීයා විභක්ති හඳුනාගෙන අර්ථ කියයි.<br>• පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග ශබ්ද මුල් විභක්ති හතරෙහි වරනැගෙන අයුරු සහ අර්ථ ගැන්වෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි.<br>• ධාතු හා ක්‍රියාපද සාධනය පිළිබඳ අවබෝධයක් ලබාගනී.<br>• ලකාර පිළිබඳ අවබෝධයක් ලබාගනී.<br>• සරල ධාතු ලට් ලකාරයෙහි වරනැගීමේ හැකියාව ලබයි.<br>• ලට් - ලඞ් ආඛ්‍යාත වාක්‍යයන්හි යෙදීමේ හැකියාව ලබයි. | 15 |
| 04. සුගම භාෂා භාවිතය සඳහා සංස්කෘත සන්ධිවිධි උපයෝගී කැරගැනීමේ හැකියාව ලබයි. | 4.1 සන්ධි හඳුන්වයි.<br>4.2 ස්වර සන්ධිය විස්තර කරයි.<br>4.3 අනුස්වාර සන්ධිය විස්තර කරයි. | ▪ සංස්කෘත භාෂාවේ සන්ධිවලට හිමි ස්ථානය පිළිබඳ ව හඳුන්වාදීම<br>▪ ස්වර සන්ධියේ මූලික ලක්‍ෂණ පැහැදිලි කරදීම.<br>▪ ස්වර සන්ධියට අයත් සන්ධි කාර්යයන් හඳුන්වා-දීම<br>▪ අනුස්වාර සන්ධියෙහි මූලික ලක්‍ෂණ හඳුන්වාදීම හා සන්ධි කාර්යයන් පිළිබඳ හඳුන්වාදීම | • සංස්කෘත සන්ධි පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබාගනියි.<br>• ස්වර සන්ධියේ මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• ස්වර සන්ධි ගළපා වාක්‍යයන්හි භාවිතයට ගනියි.<br>• පාඨයක ඇති සන්ධිපද විසන්ධි කොට අර්ථ තේරුම් ගැනීමේ හැකියාව ලබයි.<br>• අනුස්වාර සන්ධිය පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබයි.<br>• අනුස්වාර සන්ධි යෙදෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි. | 12 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 05. උක්ත, කර්ම, ආඛ්‍යාත පද සම්බන්ධය ඇතුළත් සරල වාක්‍ය නිර්මාණය කිරීම හා චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්තිවල මූලික අර්ථ හඳුනා ගැනීමේ හැකියාව ලබයි.<br>. | 5.1 උක්තය සහ වර්තමාන කාල ආඛ්‍යාත පමණක් සහිත වාක්‍ය නිර්මාණය කරයි.<br><br>5.2 උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත සරල සංස්කෘත වාක්‍ය නිර්මාණය කරයි.<br><br>5.3 චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති අර්ථ හඳුනාගෙන භාවිත කරයි. | ▪ උක්තය යනු කුමක් දැයි හඳුන්වා එය ප්‍රථමා විභක්තියෙන් පමණක් යෙදෙන බව පැහැදිලි කරදීම<br>▪ ලට් වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යය හා එම ප්‍රත්‍යය එකතු වී ආඛ්‍යාත ගොඩ නගාගන්නා අයුරු සරල ධාතූන් මගින් පැහැදිලි කරදීම<br>▪ උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත සරල වාක්‍ය ගොඩ නැගීම.<br>▪ චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති ප්‍රත්‍යය, නාම හා යොදා නාමපද සාදාගන්නා අයුරු මෙන් ම අර්ථ ගන්නා අයුරු ද පැහැදිලි කරදීම. | • උක්තපද නිවැරැදි ව ප්‍රථමා විභක්තියෙන් යොදා භාවිත කරයි.<br><br>පුරුෂත්‍රයට අනුව උක්තාඛ්‍යාත යොදා නිවැරැදි ව වාක්‍ය නිර්මාණය කරයි.<br><br>• කර්මපද හඳුනාගෙන වාක්‍යයන්හි යොදයි.<br><br>• අකාරාන්ත පුරුෂ ලිංග නාමපදවලට චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති ප්‍රත්‍ය යොදා පද නිර්මාණය කරයි.<br><br>• චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති පද ඇතුළත් වාක්‍ය නිර්මාණය කරයි. | 16 |
| 06. නාම වරනැගිලි මතකයෙන් කීමේ හැකියාව ලබාගනියි. | 6.1 අකාරන්න, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂ ලිංගික නාම වරනැගිලි නිවැරැදි ව වරනගා මතකයෙන් කියයි.<br><br>6.2 ආකාරන්න, ඉකාරාන්ත, උකාරාන්ත ස්ත්‍රී ලිංග නාම වරනැගිලි නිවැරදි ව වරනගා මතකයෙන් කියයි.<br><br>6.3 අකාරන්න, නපුංසක ලිංග නාමවරනැගිලි නිවැරැදි ව වරනගා මතකයෙන් කියයි. | ▪ සංස්කෘත නාම වරනැගිල්ලෙහි බාල, කවි, සාධු, මාලා, මති, ධෙනු, ඵල, ශබ්ද වරනැගීම.<br>▪ ඉහත පුරුෂලිංග, ස්ත්‍රීලිංග, නපුංසක ලිංග අන්ත අනුව වෙනස් නාම වරනැගීමේ දී ඇති වන වෙනස්කම් මැනැවින් පැහැදිලි කරදීම. | • පුරුෂ ලිංග ශබ්ද හඳුනාගන්නා අයුරු පෙන්වා දෙයි.<br>• පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග ශබ්ද වරනැගීමේ හැකියාව ලබයි.<br>• අන්තය අනුව වරනැගීමේ ඇති වෙනස්කම් හඳුනාගෙන භාවිත කිරීමේ හැකියාව ලබයි.<br>• වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි.<br>• පුරුෂ ලිංග ශබ්ද හා ස්ත්‍රී ලිංග ශබ්ද වරනැගීමේ ඇති වෙනස්කම් පෙන්වා දෙයි.<br>• වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි. | 12 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 07. නිර්දිෂ්ට ග්‍රන්ථ හඬනගා නිවැරැදි ව කියැවීම, දේවනාගරී අක්ෂරයෙන් ලිවීම, වනපොත් කිරීම, අර්ථ විවරණය කිරීම පිළිබඳ හැකියාව ලබා-ගනියි. | 7.1 බුද්ධගද්‍යය, නාමාෂ්ටශතකය, ව්‍යාසකාරය යන සරල සංස්කෘත ග්‍රන්ථ මැනැවින් කියවයි.<br><br>7.2 එම ග්‍රන්ථ ළයාන්විත ව සජ්ඣායනය කරයි.<br><br>7.3 ව්‍යාසකාරයේ අන්තර්ගත ශ්ලෝකවලින් තෝරාගත් කොටස් මතකයෙන් කියයි.<br><br>7.4 තෝරාගත් ශ්ලෝක නිවැරැදි ව දේවනාගරී අක්ෂරයෙන් ලියයි. | ▪ බුද්ධ ගද්‍යයේ මුල් ශ්ලොක පහ (5) කියැවීමට හුරු කරවීම.<br><br>▪ නාමාෂ්ටශතකයේ මුල් ශ්ලෝක 05 කියැවීමට හුරු කරවීම.<br><br>▪ ව්‍යාසකාරයෙන් තෝරාගත් සරල ශ්ලෝක හයක් (06) මතකයෙන් කීම සහ අර්ථාවබෝධය ඇති කරගැනීම.<br><br>▪ ඉහත කෘතිවල තෝරාගත් ශ්ලෝක කිහිපයක් දේවනාගරී අක්ෂරයෙන් ලිවීමට හුරු කරවීම. | • සරල සංස්කෘත කෘති තනි ව අධ්‍යයනය කිරීමේ හැකියාව ලබයි.<br><br>• සරල සංස්කෘත ශ්ලෝක ගායනය කිරීමේ හැකියාව ලබයි.<br><br>• සදුපදේශ භාවිතයට ගැනීමේ හැකියාව ලබයි.<br><br>• දේවනාගරී අක්ෂර භාවිතයෙන් ශ්ලෝක ලියා දක්වයි.<br><br>• නිර්දිෂ්ට කෘතිවල තෝරාගත් ශ්ලෝක මතකයෙන් කීමේ හැකියාව ලබයි. | 08 |
| 08. සංස්කෘත උපදේශ සාහිත්‍ය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ හා සාහිත්‍ය රසවින්දනයෙහි යෙදීමේ හැකියාව ලබයි. | 8.1 හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය යන ග්‍රන්ථ පිළිබඳ ව සරල දැනුමක් ලබා ගනියි.<br><br>8.2 හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය යන උපදේශ ග්‍රන්ථවලින් තෝරාගත් කොටස් කියවා රස වින්දනයේ යෙදෙයි. | ▪ උපදේශ කථා සාහිත්‍ය පිළිබඳ මැනවින් හඳුන්වාදීම.<br><br>▪ හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර යන ග්‍රන්ථ දෙක පිළිබඳ සරල අවබෝධයක් ලබා දෙයි.<br><br>• තෝරා ගත් ගද්‍ය-පද්‍ය කොටස් පරිවර්තනය කරයි. | • උපදේශ සාහිත්‍යය පිළිබඳ අවබෝධය ලබයි.<br>• සංස්කෘත උපදේශ සාහිත්‍යය හඳුනාගෙන විස්තර කරයි.<br>• හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රය ආශ්‍රිත උපදේශ උගනියි.<br>• පඤ්චතන්ත්‍රයේ සහ හිතෝපදේශයේ අන්තර්ගත ගද්‍ය පද්‍ය පාඨ නිවැරැදි ව ශබ්දනගා කියවයි.<br>• එම පාඨ මාධ්‍ය භාෂාවට නිවැරදි ව පරිවර්තනය කරයි.<br>• පඤ්චතන්ත්‍රය සහ හිතෝපදේශය ආශ්‍රයෙන් සාහිත්‍ය රස වින්දනය කරයි. | 07 |

## 10 ශ්‍රේණිය නව නිර්දිෂ්ට ග්‍රන්ථ

01. නාමෂ්ටශතකය - (මුල් ශ්ලෝක 05)
02. බුද්ධගද්‍යය - (මුල් ශ්ලෝක 05)
03. ව්‍යාසකාරය- (03, 07, 13, 27, 32, 53 යන ශ්ලෝක 06)
04. හිතෝපදේශය - මිත්‍රලාභ කාණ්ඩය දෙවන කථාව
05. පඤ්චතන්ත්‍රය - මිත්‍රභේද කාණ්ඩය පළමු කථාව (21, 22 ශ්ලෝක සහිත ව)
06. සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
07. සරල සංස්කෘත ශික්ෂකය - 1 (අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි)

## අතිරේක කියවීම් සඳහා

01. සුරභාරතී - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
02. සංස්කෘත ව්‍යාකරණ තරංගණී - පූජ්‍ය හැගොඩ ධම්මින්ද හිමි.
03. සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - (ජයදේව තිලකසිරි)
04. සංස්කෘත අකුරු ලියමු (1) ග්‍රන්ථය (සංයුක්ත තැටි දෙක සමඟ)
    ප්‍රාචී ප්‍රකාශන. කොළඹ - 2008

## 06 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් හා ආගමික භාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මධ්‍යස්ථානවල පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම, භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාවගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත්වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නොකොට පාසල් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධානය කළ යුතු යි. පාසල් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පාසලේ පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කරගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ය.

01. සංස්කෘත භාෂා දින,
02. කණ්ඩායම් සංවාද,
03. මාසික වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, ගායනය,
04. කෙටි නාට්‍ය සැකසීම, ඉදිරිපත් කිරීම,
05. බිත්ති පුවත්පත් පළ කිරීම,
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම,
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම ආදි වැඩසටහන් ඒ සඳහා උදාහරණ වේ.

## 07 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කර ගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම්පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය,  ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත්  ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල්ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍ය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. "සර්ව භාෂාසු යා ශ්‍රේෂ්ඨා " ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන්ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නොවූව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත් එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත් භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නොඉක්මවමින් පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය, (Transmisson Role) ගනුදෙනු ක්‍රමය, (Transaction Role) ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුශලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) මෙහි දී ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවෙන් අපේක්ෂා කෙරේ. ඉගැනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගැනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂය, අ. පො. ස. (සා. පෙළ) සම්බන්ධයෙන් ගත් විට භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගැනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

**01 නිපුණතාව**

සංස්කෘත අක්‍ෂරමාලාව නිවැරැදි ව කියැවීමට හා ලිවීමට හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

1.1 දේවනාගරී අක්‍ෂර මාලාව නිවැරැදි ව කියයි.
1.2 දේවනාගරී අක්‍ෂර මාලාව නිවැරැදි ව ලියයි.

**කාලච්ඡේද** 02

**ඉගෙනුම් පල**

- **ස්වර අක්ෂර මාලාව හඳුනාගෙන භාවිත කරයි.**
- **දේවනාගරී අක්ෂර ලියන පියවර හඳුනාගෙන භාවිත කරයි.**
- **ස්වර අක්ෂර මාලාව හ්‍රස්ව - දීර්ඝ වශයෙන් ප්‍රභේදගත කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

දේවනාගරී අක්‍ෂරයන්ට අනන්‍ය රූපයක් ඇත. එය ලිවීමේ නිවැරැදි පිළිවෙළක් ද ඇත. මුලින් ම අක්‍ෂරයේ මුල් රූපයත්, දෙවනුව පහළට විහිදෙන සිරස් ඉරත්, තෙවනුව තිරස් ඉරත් වශයෙන් පිළිවෙළින් ලිවීමෙන් සම්පූර්ණ අක්‍ෂරය ලිවිය හැකි ය.

| අකුර | පළමු රූපය අනන්‍ය ලක්ෂණය | දෙවන රූපය සිරස් ඉර | තෙවන රූපය තිරස් ඉර |
|---|---|---|---|
| अ | ३ | अ | अ |
| इ | इ | − | इ |
| उ | उ | − | उ |
| ऋ | > | ऋ | ऋ |
| त | c | त | त |
| ध | ध | ध | ध |

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත භාෂාවේ අක්ෂර මාලාවේ ස්වර 14 ක් ද, ව්‍යඤ්ජන 35 ක් ද වශයෙන් අක්ෂර 49 ක් ඇති බව පෙන්වා දෙන්න.
- සංස්කෘත ස්වර අක්ෂර 14 ඇතුළත් (මාතෘ භාෂාවේ ස්වර සමග) පත්‍රිකාවක් සිසුන්ට ලබාදෙන්න.
- දේවනාගරී අක්‍ෂර සෑදී ඇත්තේ කොටස් තුනකින් බව පෙන්වාදෙන්න. (1. අක්‍ෂරයේ මූලික රූපය, 2. සිරස් ඉර, 3. අවසාන තිරස් ඉර)
- අක්‍ෂර ලියන නිවැරැදි පියවර හඳුන්වාදෙන්න.
- දීර්ඝ (ඐ) (ॡ) කාරය සංස්කෘත භාෂාවේ භාවිත නොවන බව පෙන්වා දෙන්න.
- අ (अ) සිට ඌ (ऊ) දක්වා ස්වර නිවැරැදි ව කියවන්න.
- එම අක්‍ෂර පිළිවෙළින් ලියා පෙන්වන්න.
- ඍ (ऋ) සිට ඕ (ओ) දක්වා ස්වර නිවැරැදි ව කියවන්න.
- එම අක්‍ෂර සිසුන්ට පිළිවෙළින් ලියා පෙන්වන්න.
- එම අක්‍ෂර ලියැවෙන නිවැරැදි පියවර හඳුන්වාදෙන්න.
- සිසුන් ලවා නිවැරැදි ක්‍රමයට එම ස්වර **දාහතර** ම අභ්‍යාස කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත හෝඩියට දේවනාගරී හෝඩියයි ද ව්‍යවහාර කරන බව කියයි.
- සංස්කෘත අක්ෂර ලියන පිළිවෙළ අනුගමනය කරයි.
- සංස්කෘත ස්වර ප්‍රභේද සහිත ව ලියා දක්වයි.
- ස්වර දාහතර වෙන් වෙන් ව ශබ්ද නගා කියයි.

**ගුණාත්මක යෙදවුම්**

- මාතෘ භාෂාවේ ස්වර ද ඇතුළත් සංස්කෘත ස්වර 14 ක් ඇතුළත් සටහනක්
- ස්වර අක්ෂර ලියන පියවර ඇතුළත් සටහනක්.

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය
- සංස්කෘත අක්ෂර ලියන ආකාරය දැක්වෙන DVD තැටියක්
- සංස්කෘත අකුරු ලියමු

**01 නිපුණතාව**

සංස්කෘත අක්ෂරමාලාව නිවැරැදි ව කියැවීමට හා ලිවීමට හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

1.3 ව්‍යඤ්ජනාක්ෂරයන්ට ස්වර ආරෝපණය කොට ලියයි; කියයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- **සංස්කෘත හෝඩියේ ව්‍යඤ්ජන 35 ක් ඇති බව පෙන්වා දෙයි.**
- **ඒවා වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර හා ඌෂ්මාක්ෂර යනුවෙන් වර්ග තුනකට බෙදෙන බව ප්‍රකාශ කරයි.**
- **ස්වර මෙන් ම ව්‍යඤ්ජන පියවර තුනකින් ලියැවෙන බව පෙන්වා දෙයි.**
- **ව්‍යඤ්ජනවලට ස්වර ආරෝපණය වන අයුරු ලියා දක්වයි.**
- **ඇතැම් ව්‍යඤ්ජනවලට ස්වර ආරෝපණය කොට පිලි යෙදීමේ දී ඇති විශේෂතා හඳුනාගෙන භාවිත කරයි.**
- **दृ, हृ හට ऋ ස්වරය ආරෝපණය කිරීමේ දී පිල්ල යෙදෙන විට ඇති වෙනස්කම් හඳුනාගෙන භාවිත කරයි.**
- **නිවැරැදි ව පිලි යොදා වචන ලිවීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ව්‍යඤ්ජන (ගතකුරු/හල් අකුරු) තනි ව උච්චාරණය කිරීමට අපහසු ය. ඒවා क् ग् ආදි වශයෙන් දක්නට ලැබේ. එනිසා සුබෝච්චාරණය සඳහා ස්වර ආරෝපණය කොට උච්චාරණය කරනු ලබයි. ස්වරාරෝපණය නොවූ ව්‍යඤ්ජනාක්ෂරය හඳුනාගනු ලබන්නේ ව්‍යඤ්ජනයට යටින් හල් ලකුණක් යෙදීමෙනි. (अ) ස්වරය ආරෝපණය වීමේ දී හල් ලකුණ ඉවත් වේ. සෙසු ස්වරාරෝපණයන්හි දී ඒ ඒ ස්වරය නියෝජනය කරන ස්වර සංකේත (පිල්ලම්) මගින් දක්වනු ලැබේ. හලන්ත හෙවත් හසන්ත යන නමත් ස්පර්ශාක්ෂර යන නමත් ව්‍යඤ්ජනයන්ට පර්යාය පද ලෙස යෙදේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සකසාගත් ව්‍යඤ්ජන 35 ඇතුළත් පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- මාතෘභාෂාගත ව්‍යඤ්ජනාක්ෂර ආධාර කරගෙන දේවනාගරී ව්‍යඤ්ජනාක්ෂර 35 ශබ්ද නගා උච්චාරණය කරන්න.
- දේවනාගරී අක්ෂර සෑදී ඇත්තේ කොටස් තුනකින් බව යළි සිහිපත් කරන්න.
- පුවරුව ඇසුරින් ව්‍යඤ්ජනාක්ෂර ලියන පියවර හඳුන්වාදෙන්න.
- ඒවා සිසුන් ලවා නිවැරැදි අයුරින් ලිවීමට අභ්‍යාස කරවන්න.
- ව්‍යඤ්ජන අක්ෂර මාලාව වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර වශයෙන් කොටස් තුනක් ඇති බව පෙන්වා දෙන්න.
- ව්‍යඤ්ජන අක්ෂර ඇතුළත් පුවරුව ඇසුරින් වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර හා ඌෂ්මාක්ෂර හඳුන්වාදෙන්න.
- අන්තඃස්ථාක්ෂර ස්වර දෙකක එකතුවෙන් සෑදී ඇති බව පෙන්වා දෙන්න.
- ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වර සංයෝග කිරීමෙන් උච්චාරණ පහසුව ඇති වන බව පැහැදිලි කරන්න.
- මාතෘභාෂාගත ව්‍යඤ්ජනවලට ස්වර ආරෝපණය වන අයුරු පෙන්වන්න.
- ඒ ඇසුරෙන් සංස්කෘත ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වර ආරෝපණය වන අයුරු පෙන්වා දෙන්න
- ස්වර නියෝජනය කරන පිලි වෙන වෙන ම හඳුන්වා දෙන්න.

- මාතෘභාෂාගත ව පිලි යෙදූ අක්‍ෂරය උච්චාරණය කරන්න.
- උච්චාරණය කරන ලද අක්‍ෂරය දේවනාගරී අක්‍ෂර මගින් හඳුන්වා දෙන්න.
- ව්‍යඤ්ජනයකට පිලි යෙදෙන අයුරු ලෑල්ලේ ලියා පෙන්වන්න.
- සිසුන් ලවා දේවනාගරී ව්‍යඤ්ජනාක්‍ෂර කිහිපයකට පිලි යොදා ලියවන්න.
- ලියන ලද අක්‍ෂර ශබ්ද නගා උච්චාරණය කරවන්න.
- **रु** (රු) **रू** (රූ) දෙකේ විශේෂ රූපය යෙදෙන අයුරු විමැසීමට භාජනය කරන්න.
- **हृ** (හෘ) **दृ** (දෘ) අක්‍ෂරවල විශේෂත්වය පැහැදිලි කරන්න.
- එම අක්ෂර රූප ඇතුළත් වචන කිහිපයක් අභ්‍යාස පොත්වල ලියවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ව්‍යඤ්ජනාක්ෂරයක මූලික ලක්‍ෂණය පෙන්වාදෙයි.
- වර්ගාක්‍ෂර ඒ ඒ වර්ගයන්ට අනුව පෙළගස්වයි
- පිලි යෙදූ වර්ගාක්‍ෂර උච්චාරණය කරයි.
- පවර්ගයෙන් තෝරාගත් අකුරු 2 ක් පිලි යොදා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- සියලු ප්‍රභේද සහිත ව්‍යඤ්නාක්ෂර 35 ඇතුළත් පුවරුවක්.
- ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරාරූඪ වන ආකාරය දැක්වෙන සටහනක්

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය
- සංස්කෘත අක්ෂර ලියන ආකාරය දැක්වෙන DVD තැටියක්
- සංස්කෘත අකුරු ලියමු

**01 නිපුණතාව**

සංස්කෘත අක්ෂරමාලාව නිවැරැදි ව කියැවීමට හා ලිවීමට හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

**1.4** සංයුක්තාක්ෂර නිවැරැදි ව කියයි, නිවැරැදි ව ලියයි.

1.5 දේවනාගරී අක්ෂරයෙන් ලියූ සරල වචන කියවයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- **සංයුක්තාක්ෂරයක් යනු කුමක්දැ යි පැහැදිලි කරයි.**
- **සංයුක්තාක්ෂර හඳුනාගෙන නිවැරැදි ව භාවිත කිරීමේ හැකියාව ලබයි.**
- **සංයුක්තාක්ෂර සහිත ඡේද කියවීමේ හැකියාව ලබයි.**
- **විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර ලිවීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංයුක්තාක්ෂරයක් යනු ව්‍යඤ්ජන අකුරු දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට ලිවීම යි. එයින් අවසාන අක්ෂරය හැර සෙසු අක්ෂරවල මූලික ව්‍යඤ්ජන ස්වරූපය පමණක් ඉතිරි වේ. එයින් ලිවීමේ පහසුව ඇති වේ. (මම - **म्म**) වැනි තිරස් අතට (වමේ සිට දකුණට) එකතු වන සංයුක්තාක්ෂර,(කක- **क्क**) වැනි සිරස් අතට (උඩ සිට පහළට) එකතු වන සංයුක්තාක්ෂර සහ එකතු වීමේ දී විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර (ක්‍ෂ - **क्ष**) වශයෙන් ඒවා වර්ග කර දක්වනු ලැබේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සංයුක්තාක්ෂර සහිත පුවරුවක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති සංයුක්තාක්ෂර ශබ්ද නගා සාමූහික ව උච්චාරණය කරන්න.
- මාතෘභාෂාවේ එන සංයුක්තාක්ෂර සමග විශේෂ සංස්කෘත සංයුක්තාක්ෂර සසඳන්න.
  උදා: (ක්‍ෂ - **क्ष**, ඥ - **ज्ञ**, ශ්‍ර - **श्र**, ශව - **श्व**, ශව - **श्व**, කත **क्त** )
- ව්‍යඤ්ජන අක්ෂර දෙකකට වැඩි ගණනක් වුව ද සංයුක්ත ව ලිවිය හැකි බව පෙන්වා දෙන්න.
- තෝරාගත් තිරස් හා සිරස් (**म्म,क्क**) සංයුක්තාක්ෂර කිහිපයක් ලෑල්ලෙහි ලියන්න.
- ලියන ලද එම සංයුක්තාක්ෂර සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- ඒවා සිසුන් ගේ අභ්‍යාස පොත්වල ලිවීමට උපදෙස් දෙන්න.
- විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර ශබ්ද නගා උච්චාරණය කරවන්න.
- එම අක්ෂර ලියන ආකාරය ලෑල්ලේ ලියා දක්වන්න.
- මාතෘභාෂාගත බැඳි අකුරු කිහිපයක් තෝරාගෙන දේවනාගරී අක්ෂරයෙන් ලියවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- මාතෘභාෂාගත සංයුක්තාක්ෂර ලියා දක්වයි.
- අතරට ස්වර නොමැති ව ව්‍යඤ්ජන දෙකක් හෝ වැඩි ගණනක් එක ළඟ සිටි කල්හි ඊට සංයුක්ත නම ලැබෙන බව විස්තර කරයි.
- සිංහල හෝ මාතෘභාෂාගත බැඳි අකුරු දේවනාගරී අක්ෂරයෙන් ලියා දක්වයි.
- බැඳි අකුරුවල ප්‍රභේද කිහිපයක් ඇති බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සංයුක්තාක්ෂර සියල්ල ඇතුළත් පුවරුවක්.

- සංයුක්තාක්ෂර දැක්වෙන DVD තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය, සංස්කෘත බාලාදර්ශය

**02 නිපුණතාව**

වචන භේදය හා ලිංගභේදය පිළිබඳ වත්, මාධ්‍ය භාෂාවේ වචන භේදය, ලිංගභේදය අතර ඇති වෙනස්කම් පිළිබඳ වත් අවබෝධ කරගැනීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

2.1 ඒකවචන, ද්විවචන, බහුවචන භේදය හඳුන්වයි

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- **සංස්කෘත නාමපදවල වචනත්‍රයක් ඇති බව අවබෝධ කරගෙන භාවිත කරයි.**
- **සංස්කෘත භාෂාවේ ක්‍රියාපදවල ද වචනත්‍රයක් ඇති බව පැහැදිලි කරයි.**
- **මාධ්‍ය භාෂාවෙන් ඒවාට අර්ථ දක්වයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

නාම පදයක් වරනැගීමේ දී සංස්කෘත භාෂාවේ වචන භේදය අනෙක් භාෂාවලට වඩා වෙනස් වේ. එනම් ඒකවචන, ද්විවචන, බහුවචන වශයෙන් වචනත්‍රයක් ඇත. එක් දෙයක් හෝ එක් අයකු හැඳින්වීමට ඒකවචනයත්, දෙකක් හෝ දෙදෙනකු හැඳින්වීමට ද්විවචනයත්, දෙකකට හෝ දෙදෙනකුට වඩා වැඩි පිරිසක් හැඳින්වීමට බහුවචනයත් භාවිත වේ. තුන් ලිඟුවෙහි ම නාමපද වචනත්‍රයෙහි වරනැගෙන අතර ලිංග අනුව ආඛ්‍යාත පදය වෙනස් නො වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නාමපද හා ක්‍රියාපද කිහිපයක් වචනත්‍රයේ යොදා සකස් කළ වගුවක් සිසුන්ට ලබා දෙන්න.
- නාමපදවල ඒක වචන, ද්විවචන, බහුවචන යනු මොනවා ද යි විස්තර කර දෙන්න.
- වචනත්‍රයේ යෙදෙන නාමපද කිහිපයක් වගුව ඇසුරෙන් පෙන්වා දෙන්න.
- ඒවායේ අර්ථ පැහැදිලි කරදෙන්න.
- ක්‍රියාපදවල ද ඒක වචන, ද්වි වචන, බහු වචන භේදය ඇති බව පෙන්වා දෙන්න.
- ඒවා භාෂාවේ යෙදෙන අයුරු වගුව ඇසුරින් පහදන්න.
- ඒවායේ අර්ථය පැහැදිලි කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- නාම පද කිහිපයක ඒකවචන, ද්විවචන, බහුවචන වගුගත කොට දක්වයි.
- ඒවායේ අර්ථ ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- නාමපද හා ක්‍රියාපද කීපයක් වචනත්‍රයේ යොදා සකස් කළ වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය

- මූලික පිරිවෙන සංස්කෘත 2 පොත

**02 නිපුණතාව**

වචනභේදය හා ලිංගභේදය පිළිබඳ වත්, මාධ්‍ය භාෂාවේ වචන භේදය, ලිංග භේදය අතර ඇති වෙනස්කම් පිළිබඳ වත් අවබෝධ කරගැනීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

2.2 මාධ්‍ය භාෂාවේ ලිංග භේදයෙන් සංස්කෘත භාෂාවේ ලිංග භේදය වෙනස් වන අයුරු හඳුනාගනියි.

2.3 ලිංගභේදය අනුව ඒ ඒ නාමපදයන් හා වචන භේදයන් වටහාගනියි.

**කාලච්ඡේද 05**

**ඉගෙනුම් පල**

- **සංස්කෘත භාෂාවේ හා මාතෘ භාෂාවේ ලිංග භේදයන් අතර ඇති වෙනස පෙන්වා දෙයි.**
- **ලිංග අනුව ක්‍රියාපදය වෙනස් නොවන බව අවබෝධ කරගෙන කියයි.**
- **පුරුෂලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග පද වෙන් වෙන් ව ප්‍රකාශ කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සිංහල ව්‍යවහාරයේ යෙදෙන වචනවල පුරුෂ වාච්‍යාර්ථයක් හැඟවෙන ශබ්ද පුරුෂලිංගික ලෙස ද, ස්ත්‍රී වාච්‍යාර්ථයක් හැඟවෙන ශබ්ද ස්ත්‍රීලිංගික ලෙස ද, මෙම වර්ග දෙකට අයත් නොවන නපුංසක වාච්‍යාර්ථයක් ව්‍යවහාර වන ශබ්ද නපුංසකලිංගික ශබ්ද ලෙස ද සැලකේ. එහෙත් සංස්කෘතයේ ඇතැම් නපුංසකලිංගික පද ආදියේ පටන් ම පුරුෂලිංගික හා ස්ත්‍රීලිංගික ව යෙදෙන අවස්ථා දක්නා ලැබේ. වෘක්‍ෂ - **वृक्ष** (ගස) (පුරුෂලිංග), ලතා - **लता** (වැල) (ස්ත්‍රී ලිංග) වැනි ශබ්ද ව්‍යවහාරයෙන් ම හඳුනාගත යුතු ය. පුරුෂාර්ථවාචී හා ස්ත්‍රී වාචී පද සඳහා ද නපුංසකලිංග පද යොදා ගනී. (මිත්‍රම්) - **मित्रम्** (මිතුරා) / (කලත්‍රම්) - **कलत्रम्** (ජීවිතයේ සහකරු හෙවත් කලත්‍රයා) වැනි ශබ්ද උදාහරණ වේ. මේවා භාවිතයෙන් ම උගත යුතු ය. සංස්කෘතයේ ලිංග භේදය නිශ්චිත ව දැක්විය නොහැකි අතර එය භාෂා භාවිතයෙන් හා ශබ්දකෝෂ පරිශීලනයෙන් ද දැනගත යුතු ය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත භාෂාවේ තුන් ලිඟුවට අයත් වචන මාලාවක් (තේරුම් සහිත ව) ඇතුළත් පුවරුවක් සිසුන්ට ලබාදෙන්න.
- එහි ඇති නාමපද මාතෘ භාෂාවේ ලිංගයෙන් වෙනස් වන අයුරු පෙන්වා දෙන්න.
- ලිංග අනුව ක්‍රියාපදය වෙනස් නොවන බව පැහැදිලි කරන්න.
- පුරුෂ, ස්ත්‍රී, නපුංසක ලිංග නාමපද ඇතුළත් වගුවක් සිසුන්ට ලබාදෙන්න.
- පුරුෂලිංග පද හඳුන්වාදෙන්න.
- ස්ත්‍රීලිංග පද හඳුන්වාදෙන්න.
- නපුංසකලිංග පද හඳුන්වාදෙන්න.
- පුවරුව ඇසුරින් ලිංගත්‍රයට අයත් ශබ්ද වරනැගීමේ දී වචනත්‍රයක් ඇති බව පෙන්වා දෙන්න.
- වචනත්‍රයට අදාළ ව අර්ථ වෙනස් වන අයුරු පෙන්වා දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- දෙනු ලබන නාමපද 15ක් ලිංගත්‍රයෙහි වර්ග කර දක්වයි.

- නාමපද කිහිපයක් මුල් විභක්ති තුනෙහි (ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා) වචනත්‍රයට වරනගා දක්වයි.
- පුරුෂලිංග නාමපදයක් ඒකවචන, ද්විවචන, බහුවචන වශයෙන් ආඛ්‍යාත පදයක් සමග ගලපා කෙටි වාක්‍ය සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- **ලිඟු තුනට වර්ග කළ නාම පද ඇතුළත් වගුවක්**

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය

**03 නිපුණතාව**

සරල වාක්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

3.1 නාමයක් විභක්ති ගන්වන අයුරු වටහාගනියි.
3.2 විභක්තිගත නාමයක විභක්ත්‍යර්ථය නිවැරැදි ව ප්‍රකාශ කරයි.
3.3 ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා, තෘතීයා විභක්ති හඳුනාගනී.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- **නාම හා නාමපද අතර ඇති වෙනස පැහැදිලි කරයි.**
- **ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා, තෘතීයා විභක්ති හඳුනාගෙන අර්ථ කියයි.**
- **එම විභක්තිවල වරනැගුණු නාම පද වාක්‍යවල යොදන අයුරු පෙන්වාදෙයි.**
- **පුරුෂලිංග ශබ්ද මුල් විභක්ති හතරෙහි වරනැගෙන අයුරු සහ අර්ථ ගැන්වෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි.**
- **ස්ත්‍රීලිංග ශබ්ද මුල් විභක්ති හතරෙහි වරනැගෙන අයුරු සහ අර්ථ ගැන්වෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘතයේ ප්‍රධාන විභක්ති අටකි. සංස්කෘතයේ භාවිත සියලු නාමපද එකී විභක්ති අට සමග වරනැගේ. ඒ අනුව නාමපදයන්හි එම විභක්ති අටට අනන්‍ය වූ අර්ථ ඇත. සිංහලයේ භාවිත වන කර්තෘ හා කරණ විභක්ති දෙක ම සඳහා සංස්කෘතයේ භාවිත වන්නේ තෘතීයා විභක්තිය බව සැලැකිය යුතු යි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ශබ්ද ප්‍රකෘතිය කුමක් ද යි සරල ව හඳුන්වා දෙන්න.
- විභක්ති ප්‍රත්‍යය එකතු වීමෙන් නාමපදයක් සෑදෙන අයුරු වටහා දෙන්න.
- ශබ්ද ප්‍රකෘතියට විභක්ති ප්‍රත්‍යය එකතු වීමෙන් සෑදෙන නාම පදය වාක්‍යයක, ඉටු කරන කාර්යය පැහැදිලි කරන්න.
- **१ बालकः क्रीडति।　　२ छात्रः पुस्तकं पठति**
- **३ हे पुत्र त्वं खाद।　　४ बालकः हस्तेन कन्दुकं ताडयति ।**
- ඉහත වැකිවලට අදාළ නාමපද ඇතුළත් විභක්ති හඳුන්වා දෙන්න.
- ප්‍රථමා විභක්තිය හා උක්තය අතර ඇති සම්බන්ධය හඳුන්වා දෙන්න.
- සම්බෝධන විභක්තිය හඳුන්වා දෙන්න.
- ද්විතීයා විභක්තිය, අනුක්ත කර්මය හා තෘතීයා විභක්තිය හඳුන්වා දෙන්න.
- මුල් විභක්ති හතරෙහි (**ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා, තෘතීයා**) නාම පදයක් වරනැගෙන ආකාරය වගුවක් ඇසුරින් පැහැදිලි කරදෙන්න.

- වරනැගීම් වගුවක් ඇසුරෙන් සුදුසු නාම පදයක් වරනගා පෙන්වන්න.
- සිසුන්ට ද එසේ නාමපදයක් වරනැගීමට අවස්ථාව ලබාදෙන්න.
- විභක්ති අනුව නාම පදය හා එහි අර්ථය වෙනස් වන බව පෙන්වාදෙන්න.
- ස්ත්‍රී ලිංග නාම පදයක් වරනැගෙන වගුවක් ලබාදෙන්න.
- ස්ත්‍රි ලිංග ශබ්ද සිසුන්ට වරනගා පෙන්වන්න.
- සිසුන් සමග එම ශබ්ද හඩනගා වරනගන්න.
- විභක්ති හතරෙහි ඒක වචනයෙහි ඇති සම විෂමතා පෙන්වාදෙන්න.
- එම විභක්තීන්හි සාමාන්‍ය අර්ථය පැහැදිලි කරදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත භාෂාවේ ඇති විභක්ති අට මතකයෙන් කියයි.
- එම විභක්තිවල යෙදෙන අර්ථ ප්‍රකාශ කරයි.
- දෙනු ලබන නාමපදයක් ''ප්‍රථමා , සම්බෝධන , ද්විතියා , තෘතීයා'' විභක්ති 04 හි වර නගයි.

**ගුණාත්මක යෙදවුම්**

- නාමපදයක් වරනැගෙන වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාම වරනැගීම් දැක්වෙන DVD තැටියක්

**03 නිපුණතාව**

සරල වාක්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

3.4 **ලට් – ලඞ්** යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරැදි ව වරනගයි.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- **ධාතු හා ක්‍රියාපද සාධනය පිළිබඳ අවබෝධයක් ලබාගනී.**
- **ලකාර පිළිබඳ අවබෝධයක් ලබාගනී.**
- **සරල ධාතු ලට් ලකාරයෙහි වරනැගීමේ හැකියාව ලබයි.**
- **අනද්‍යතනාතීත ලඞ් හි වරනැගීමේ හැකියාව ලබයි.**
- **ලට් - ලඞ් ආඛ්‍යාත වාක්‍යයන්හි යෙදීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත භාෂාවේ පද වර්ග 04 කි. එනම්, නාම, ක්‍රියා, නිපාත, උපසර්ග යනුවෙනි. ධාතු මූලික භාෂාවක් වන සංස්කෘත භාෂාවේ ක්‍රියා පදයට විශේෂ ස්ථානයක් හිමි වේ. ක්‍රියා පදයක මූලය ධාතු නමින් හැඳින්වේ. ශබ්ද ප්‍රකෘතියට නාම විභක්ති ප්‍රත්‍යය එකතු වී නාමපදයක් නිර්මාණය වන්නාක් මෙන් ධාතුවකට හෙවත් ක්‍රියා මූලයකට ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයක් එකතු වීමෙන් පූර්ණ ක්‍රියා පදයක් නිර්මාණය වේ. සංස්කෘතයේ වරනැගෙන ආකාරය අනුව ධාතු''ගණ'' වශයෙන් 10 ක් දක්වනු ලැබේ. ඒවා මෙසේ ය.

| | | | |
|---|---|---|---|
| 1. | භුවාදි ගණය | 6. | තුදාදි ගණය |
| 2. | අදාදි ගණය | 7. | රුධාදි ගණය |
| 3. | හ්වාදි ගණය | 8. | තනාදි ගණය |
| 4. | දිවාදි ගණය | 9. | ක්‍ර්‍යාදි ගණය |
| 5. | ස්වාදි ගණය | 10. | චුරාදි ගණය |

මේ ගණ 10 වරනැගීමේ දී යම් යම් සමාන ලක්ෂණ දරන 1,4.6,10 ධාතු ගණ වරනැගීම I වැනි ධාතු වරනැගීම යනුවෙන් හැඳින්වේ. සෙසු ධාතු ගණ 06 වරනැගීම 02 වැනි ධාතු වරනැගීම යනුවෙන් හැඳින්වේ. එම ධාතු වරනැගෙන ලකාර 10කි. ක්‍රියා පිළිබඳ ව කාලත්‍රයක් තිබුණ ද සංස්කෘත භාෂා භාවිතයේ ක්‍රියා පදය පුළුල් පරාසයක විහිදී තුබූ බව පෙනේ. ඒ අනුව ආඛ්‍යාත පද කාලවාචී (tenses) සහ ප්‍රකාරවාචී (moods) වශයෙන් ප්‍රධාන වර්ග දෙකකට බෙදේ. එය පහත දැක්වේ.

1. කාලවාචී ලකාර

| | | |
|---|---|---|
| වර්තමාන | ලට් | - වර්තමාන කාලය හඟවයි. |
| අතීත | ලිට් | - පරෝක්ෂා (නුදුටු අතීත කාලය හඟවයි) |
| | ලඞ් | - අනද්‍යතනාතීත (අදට වඩා ඈත අතීතය හඟවයි) |
| | ලුඞ් | - අද්‍යතනාතීත (අද අතීතය හඟවයි) |

| | | |
|---|---|---|
| අනාගත | लुट् | - ශ්වස්තන - නුදුරු (හෙට) අනාගතය හඟවයි) |
| | लृट् | - භවිෂ්‍යත් (මතු) අනාගතය හඟවයි) |
| අතීත - අනාගත | लृङ् | - ක්‍රියාතික්‍රම (අනාගතවාචී) අතීත කාලය අනියමාර්ථ අසම්භාව්‍ය - අතීත අනාගතාර්ථ |

<u>2. ප්‍රකාරවාචී ලකාර</u>

| | |
|---|---|
| लोट् | - ආඥාර්ථක සහ ප්‍රේරණාර්ථක |
| लिङ् (विधि) | - විධි සහ සම්භාවනාර්ථක |
| लिङ् (आशिर्) | - ආශීර්වාද |

එම ලකාර 10 අතරින් බහුල ව භාවිත වන लट् වර්තමාන හා लङ् අනද්‍යතන අතීත ලකාර දෙකේ පරස්මෛපද ආඛ්‍යාත රූප කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම අපේක්‍ෂා කෙරේ. 1,4,6,10 යන ධාතු ගණවල ධාතු වරනැගීමේ දී ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර විකරණයක් එකතු වීම විශේෂ ලක්‍ෂණයකි. මේ ධාතු ගණ අතුරින් 1 -6 ධාතු ගණ अ විකරණය යෙදීමෙන් සමාන වේ. එහෙත් පළමුවැනි ධාතු ගණයේ ධාතුවල අතරින් අන්ත්‍ය ස්වරය හා හ්‍රස්ව උපධා ස්වරය ගුණ වේ.

★ भू + अ + ति
भो + अ + ति > भव् + अ + ति > भवति । (ස්වරයකට පූර්ව ओ කාරය अव् බවට පත් වේ)

★ नी + अ + ति > ने+ ति । ස්වරයකට පූර්ව ए කාරය अय् බවට පත් වේ.

★ नय् + अ + ति । > नयति

★ जीव् +अ + ति > जीवति (මෙහි උපධා ස්වරය දීර්ඝ ई හෙයින් ගුණ නොවේ)
बुध् +बोध् > + अ + ति > बोधति

★ सृ > सर् + अ + ति > सरति । එහෙත් 06 වැනි ධාතු ගණයේ එසේ ධාතු ගුණ නොවේ.

★ विश् > + अ + ति > विशति । ධාතුව ගුණ නොවේ.

★ विद् > विन्द् । වේ. ඇතැම් විට ධාතුවට අනුනාසිකයක් එකතු වේ.
सिच् > सिञ्च । වේ.
मुच् > मुञ्च । වේ.

★ එහෙත් 06 වැනි ධාතු ගණයෙහි මෙසේ ගුණ නොවන හෙයින් विश्+ अ + ति > विशति ලෙස යෙදේ.

★ 04 වන ධාතු ගණයෙහි විකරණ " य " වේ.

| | |
|---|---|
| दिव् + य + ति | तुष् + य + ति |
| दिव् + य + ति ( මෙහි උපධා ස්වරය දීර්ඝ වේ ) | अस् + य + ति |
| दीव्यति । | अस्यति । (විසි කරයි ) |

★ 10 වන ධාතු ගණයෙහි ධාතුවටත් විභක්ති ප්‍රත්‍යයටත් අතර अय විකරණය යෙදේ. මෙහි දී ධාතුවේ ස්වරය ගුණ වේ. ඇතැම් විට වෘද්ධි බවට පත් වේ.
चुर् + अय + ति
चोर् + अय + ति (ධාතුවේ ස්වරය ගුණ වීමෙනි)
चोरयति ।

तड् + अय+ ति

ताड् + अय+ ति (ධාතුවේ ස්වරය වෘද්ධි වීමෙනි)

ताडयति ।

कम् + अय + ति

काम् + अय + ति (වෘද්ධි වීමෙනි)

कामयति

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- 'ලට්' හා 'ලඞ්' ලකාරවල ධාතූන් වරනැගෙන ආකාරය දැක්වෙන වගුවක් සිසුන් වෙත ලබා දෙන්න.
- ඇමුණුමේ එන සංස්කෘත ලද් පරස්මෛපද ක්‍රියාවක් වරනගා පෙන්වන්න.
- එම ක්‍රියා වරනැගීම සිසුන් සමග සාමූහික ව කියවන්න.
- එම ක්‍රියා වරනැගීම වෙන් වෙන් ව සිසුන්ට හඬ නගා කියැවීමට අවස්ථාව දෙන්න.
- සමාන ව වරනැගෙන වෙනත් ධාතු හඳුන්වා දෙන්න.
- එවැනි සමාන ධාතු සිසුන්ට තනි තනි ව වරනැගීමට ඉඩ සලස්වන්න.
- වගුවේ එන ලඞ් පරස්මෛපද ක්‍රියාව වරනගා පෙන්වන්න.
- එම ක්‍රියා වරනැගීම සිසුන් සමග සාමූහික ව කියවන්න.
- වෙනත් ක්‍රියා පද ලඞ් ලකාරයෙහි වරනගා පෙන්වන්න.
- ක්‍රියාපදයක් ලඞ් ලකාරයෙහි වරනගා ලිවීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ක්‍රියා පද කිහිපයක් ලද් ලකාර පරස්මෛපදයෙහි වරනගයි.
- ලද් ක්‍රියා නිවැරැදි ව වාක්‍යයන්හි යොදයි.
- ක්‍රියා පද ලඞ් ලකාර පරස්මෛපදයෙහි වරනගයි.
- වෙනත් ක්‍රියා ලඞ් පරස්මෛපදයෙහි වරනගයි.
- ලඞ් පරස්මෛපද ක්‍රියා පදවල අර්ථ මැනැවින් කියයි.
- ලඞ් ක්‍රියා නිවැරැදි ව වාක්‍යයන්හි යොදයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධාතු වරනැගීමේ වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල

**04 නිපුණතාව**

සුගම භාෂා භාවිතය සඳහා සංස්කෘත සන්ධි විධි උපයෝගී කර ගැනීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

4.1 සන්ධි හඳුන්වයි

4.2 ස්වර සන්ධි විස්තර කරයි.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- **සංස්කෘත සන්ධි පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබාගනියි.**
- **සන්ධි කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාගනී.**
- **ස්වර සන්ධියේ මූලික ලක්ෂණ විස්තර කරයි.**
- **ස්වර සන්ධි ගලපා වාක්‍යයන්හි භාවිතයට ගනියි.**
- **පාඨයක ඇති සන්ධිපද විසන්ධි කොට අර්ථ තේරුම් ගැනීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත භාෂාවේ සෑම වාක්‍යයක් ම අඛණ්ඩ අක්ෂරාවලියක් ලෙස සැලැකේ. පෙර පදයේ අග අකුර පර පදයේ මුල් අකුර හා සංයෝග කිරීම සන්ධි (එක් කිරීම, බැඳීම) යනුවෙන් හැඳින්වේ. සන්ධි නීති ප්‍රධාන වශයෙන් ඡේදහරණය හා සමරූපීකරණය පදනම් කොට තැනී ඇත. බාහිර හා අභ්‍යන්තර වශයෙන් සන්ධි වර්ග දෙකක් ප්‍රධාන වෙයි. එක ම පදයක් ඇතුළත පිහිටියේ අභ්‍යන්තර සන්ධි නම්. පද දෙකක් අතර සිදුවන ගැළැපීමෙන් බාහිර සන්ධි පද සෑදේ. සන්ධි කිරීමට මත්තෙන් ස්වර ව්‍යඤ්ජන වෙන් කරගැනීම හා නාම හෝ ශබ්ද ප්‍රකෘති වෙන් කරගැනීම සන්ධි කාර්යය වඩාත් පහසු කරවයි. සංස්කෘතයේ සන්ධි වන අවස්ථා තුනකි.

1. ස්වර ස්වර අතර සිදුවන සන්ධි වීම (පෙර පදයේ අග ස්වරයත් පර පදයේ මුල් ස්වරයක් සන්ධි වීම)
2. ව්‍යඤ්ජන ස්වර අතර සිදුවන සන්ධි වීම (පෙර පදයේ අග ව්‍යඤ්ජන හා පරපදයේ මුල් ව්‍යඤ්ජනය සන්ධි වීම)
3. සන්ධි සිදු නොවන්නේ පෙර පදයේ අග ස්වරයක් හා පර පදයේ මුල් ව්‍යඤ්ජනයක් සිටි විට සන්ධි නොවේ. මෙය ලෝපශ් වීම ලෙස සැලකේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සන්ධි වන අවස්ථා තුනට උදාහරණ පද ඇතුළත් වගුවක් සිසුන් වෙත ඉදිරිපත් කරන්න.
- සන්ධි යනු කුමක්දැයි නිවැරදි ව හඳුන්වන්න.
- සන්ධි කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාදෙන්න. (දීර්ඝ, ලෝප, ලෝපශ්, ගුණ, වෘද්ධි)
- සන්ධිවලට අවශ්‍ය මූලික සංඥා වන සවර්ණ, ගුණ හා වෘද්ධි ස්වර හඳුන්වා දෙන්න.
- සංස්කෘත භාෂාවේ සන්ධිවල වැදගත්කම පිළිබඳ ව පහදා දෙන්න.
- වගුව ආශ්‍රයෙන් ප්‍රධාන වශයෙන් සන්ධි වන අවස්ථා තුන පෙන්වාදෙන්න.
- ස්වර සන්ධි හඳුන්වාදෙන්න
- වගුව ආශ්‍රයෙන් ස්වර සන්ධි සිදුවන අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබාදෙන්න.
- ස්වර සන්ධියේ අවස්ථා එකින් එක පැහැදිලි කරදෙන්න. (දීර්ඝ, ගුණ, වෘද්ධි, ව්‍යස්ත ආදි වශයෙන් සරල ස්වර සන්ධි කිහිපයක් සන්ධි කර දක්වන්න)
- විවිධ ස්වර සන්ධි ඇතුළත් ගොනුවක් ලබාදෙන්න.
- ඒවා එකින් එක සිසුන් ලවා අභ්‍යාස කරවන්න.
- එම ස්වර සන්ධි පද ඇතුළත් කොට වාක්‍ය කිහිපයක් තනවන්න.
- ස්වර සන්ධි ඇතුළත් ගද්‍ය පාඨයක් ලබාදෙන්න.
- එහි අන්තර්ගත ස්වර සන්ධි උපුටා දක්වන්නට සිසුන්ට අවස්ථාවක් ලබාදෙන්න.
- ඒවා දීර්ඝ, ගුණ, වෘද්ධි, ව්‍යස්ත වශයෙන් ගොනු කර දැක්වීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සන්ධි යනු කුමක්දැයි විස්තර කරයි.
- ස්වර සන්ධිය සිදුවන අන්දම උදාහරණයක් ඇසුරෙන් පෙන්වාදෙයි.
- ස්වර සන්ධියේ අවස්ථා සඳහා උදාහරණ සපයයි.

**ගුණාත්මක යෙදවුම්**

- සන්ධි වන අවස්ථා තුනට උදාහරණ පද ඇතුළත් වගුවක්.

- සන්ධි ගැන විස්තර වන DVD තැටියක්.

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත ව්‍යාකරණ තරංගණී - හැගොඩ ධම්මින්ද හිමි.

**04 නිපුණතාව**

සුගම භාෂා භාවිතය සඳහා සංස්කෘත සන්ධි විධි උපයෝගී කැරගැනීමේ හැකියාව ලබයි

**නිපුණතා මට්ටම**

4.3 අනුස්වාර සන්ධිය විස්තර කරයි.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- **අනුස්වාර සන්ධිය පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබයි.**
- **අනුස්වාර සන්ධි විධි හඳුන්වා දෙයි.**
- **අනුස්වාර සන්ධි යෙදෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘතයේ ඇති අනුස්වාරය සිංහල භාෂාවේ බිංදුව ලෙස හැඳින්වේ. පාලි භාෂාවේ නිග්ගහීතය ලෙස හැඳින්වේ. සංස්කෘතයේ අනුස්වාරය බවට පත් වන්නේ 'ම්' ව්‍යඤ්ජනයයි. එය ස්වරයක් ඉදිරියෙහි නොවෙනස් වේ. උදා - කිම් + අත්‍ර වැනි තැන්වල මෙනි. එහෙත් ව්‍යඤ්ජනයකට පූර්වයෙන් සිටි කල අනුස්වාරය බවට පත් වේ.

උදා:- **तम्** + **वेद** > **तं वेद** ( තම් + වෙද ) > තං වෙද

**किम्** + **अत्र** > **किम् अत्र** ( කිම් + අත්‍ර ) > කිමත්‍ර

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- අනුස්වාර සන්ධියට අයත් සන්ධිපද සමූහයක් ඇතුළත් වගුවක් සිසුන් වෙත ලබා දෙන්න.
- වගුව ඇසුරෙන් අනුස්වාර සන්ධි හඳුන්වා දෙන්න
- විවිධ අනුස්වාර සන්ධි ඇතුළත් ගොනුවක් ලබාදෙන්න.
- ඒවා එකින් එක සිසුන් ලවා අභ්‍යාස කරවන්න.
- එම අනුස්වාර සන්ධි පද ඇතුළත් කොට වාක්‍ය කිහිපයක් තනවන්න.
- අනුස්වාර සන්ධි ඇතුළත් ගද්‍ය පාඨයක් ලබාදෙන්න.
- එහි අන්තර්ගත අනුස්වාර සන්ධි උපුටා දක්වන්නට සිසුන්ට අවස්ථාවක් ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත භාෂාවේ අනුස්වාරයට තවත් නම් උගනී.
- සංස්කෘත අනුස්වාර සන්ධි පද සඳහා උදාහරණ ලියයි.
- සංස්කෘත අනුස්වාර විසන්ධි පද සන්ධි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- අනුස්වර සන්ධි පද ඇතුළත් වගුවක්
- සන්ධි පිළිබඳ විස්තර ඇතුළත් DVD තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත ව්‍යාකරණ තරංගණී - හැගොඩ ධම්මින්ද හිමි.

**05 නිපුණතාව**

උක්ත, කර්ම, ආඛ්‍යාත පද සම්බන්ධය ඇතුළත් සරල වාක්‍ය නිර්මාණය කිරීම හා චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්තිවල මූලික අර්ථ හඳුනාගැනීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

**5.1** උක්තය සහ වර්තමානකාල ආඛ්‍යාත පමණක් සහිත වාක්‍ය නිර්මාණය කරයි.

**5.2** උක්ත කර්ම ආඛ්‍යාත සහිත සරල සංස්කෘත වාක්‍ය නිර්මාණය කරයි.

කාලච්ඡේද 08

**ඉගෙනුම් පල**

- **උක්තපද නිවැරැදි ව ප්‍රථමා විභක්තියෙන් යොදා භාවිත කරයි.**
- **පුරුෂත්‍රයට අනුව උක්තාඛ්‍යාත යොදා නිවැරැදි ව වාක්‍ය නිර්මාණය කරයි.**
- **කර්මපද හඳුනාගෙන වාක්‍යයන්හි යොදයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**උක්තය** යනු ක්‍රියාවෙන් කියැවෙන, ප්‍රකාශ වන පදය යි. එය නිරන්තරයෙන් ම **ප්‍රථමාවෙන්** තැබිය යුතු ය. ආඛ්‍යාතයේ පුරුෂය හා වචනය අනුව අතිශයින් ගැළපෙන සේ කර්තෘපද (සඃ, ත්වං, අහං ආදි) සමාන කොට තැබීම උක්ත කිරීම වශයෙන් හැඳින්වේ. ආඛ්‍යාතයට හෙවත් ක්‍රියාවට හසු වන, යටත් වන දෙය **කර්මය යි.** එය **ද්විතීයා** විභක්ති ගනී. මේ පිළිබඳ වැඩිපුර අවබෝධයක් ලබාගැනීමට සරල සංස්කෘත ශික්ෂකය පළමු පොතෙහි මුල් පාඩම් 15 හා බාලාදර්ශයෙහි මුල් පාඩම් 5 උපයෝගී කරගන්න.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකයේ 6 - 10 පාඩම් ඇසුරින් උක්තය, කර්මය ඇතුළත් වාක්‍ය කිහිපයක වගුවක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- උක්තය යනු කුමක්දැ යි මාතෘභාෂාගත සරල වාක්‍ය කිහිපයක් ඇසුරින් පැහැදිලි කරන්න.
- එම වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කොට පෙන්වන්න.
- සාවද්‍ය සරල වාක්‍ය හා එහි නිවැරැදි රූප පෙන්වා දෙන්න.
- එමගින් උක්තය පිළිබඳ නිවැරැදි අවබෝධයක් ලබාදෙන්න.
- පුරුෂත්‍රයට අයත් ආඛ්‍යාතපද හඳුන්වාදෙන්න.
- ලට් වර්තමානකාල ආඛ්‍යාත ප්‍රත්‍යය හඳුන්වාදෙන්න.
- සරල ධාතුන්ට එම ආඛ්‍යාත ප්‍රත්‍ය එකතු වී ආඛ්‍යාත ගොඩනගා ගන්නා අයුරු පෙන්වාදෙන්න.
- වගුව ඇසුරින් උක්තපද සියල්ල ප්‍රථමා විභක්තියෙන් යෙදී ඇති බව පැහැදිලි කරදෙන්න.
- වගුව ඇසුරින් සරල වාක්‍ය කිහිපයක් නිර්මාණය කොට පෙන්වන්න.
- එවැනි සරල වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- **කර්මය** පිළිබඳ හඳුන්වාදෙන්න.
- **කර්මපද** ද්විතීයා විභක්තියෙන් යෙදෙන බව පෙන්වා දෙන්න.
- උක්ත, කර්ම, ආඛ්‍යාත පමණක් ඇතුළත් සරල වාක්‍ය පැහැදිලි කර දෙන්න
- එම වාක්‍යයන්හි යෙදී ඇති කර්ම පද පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න.
- උක්තපද කර්මපදවලට හැරවීමේ අභ්‍යාසයක යොදවන්න.
- කර්මපද උක්තපදවලට හැරවීමේ අභ්‍යාසයක ද යොදවන්න.
- උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත සරල වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සරල ආඛ්‍යා පද එක්රැස් කොට ගොනුවක් සකස් කරයි.
- ඉන් කිහිපයක් 'ලට්' පරස්මෛපදයෙහි වරනගා දක්වයි.
- සරල වාක්‍යයන්හි ඇතුළත් උක්ත, කර්ම, ආඛ්‍යාතපද වෙන් වෙන් ව උපුටා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත සකස් කරගත් වගුවක්.

**වැඩිදුර ගවේෂණය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය
- සංස්කෘත බාලාදර්ශය

**05 නිපුණතාව**

උක්ත, කර්ම, ආඛ්‍යාත පද සම්බන්ධය ඇතුළත් සරල වාක්‍ය නිර්මාණය කිරීම හා චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්තිවල මූලික අර්ථ හඳුනාගැනීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

5.3 චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති අර්ථ හඳුනාගෙන භාවිත කරයි.

කාලච්ඡේද 08

**ඉගෙනුම් පල**

- **අකාරාන්ත පුරුෂලිංග නාමපදවලට චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති ප්‍රත්‍ය යොදා පද නිර්මාණය කරයි.**
- **එම විභක්තිපද ඇතුළත් වාක්‍ය පරිවර්තනය කරයි.**
- **චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්තිපද ඇතුළත් වාක්‍ය නිර්මාණය කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පුරුෂලිංග අකාරාන්ත ශබ්ද ආශ්‍රයෙන් පමණක් **චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී** විභක්ති ප්‍රත්‍ය යොදා එම විභක්ති හඳුන්වාදීම, ඒවායේ අර්ථ ගැන්වීමට හුරු කරවීම හා වාක්‍යයන් නිර්මාණය කිරීමට පෙළඹවීම මෙම නිපුණතා මට්ටමේ දී ප්‍රමාණවත් වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකයේ 12 - 15 පාඩම් ආශ්‍රයෙන් චතුර්ථී විභක්ති ප්‍රත්‍යය හඳුන්වාදෙන්න.
- පුරුෂලිංග අකාරාන්ත ශබ්දයකට එම ප්‍රත්‍යය යොදා චතුර්ථී විභක්ති පද සාදාගන්නා අයුරු පෙන්වා දෙන්න.
- එම චතුර්ථී විභක්තිපද අර්ථ ගන්වන අයුරු පෙන්වාදෙන්න.
- චතුර්ථී විභක්තිපද කිහිපයක් ලබා දී අර්ථ ගැන්වීමට ඉඩ සලස්වන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් චතුර්ථී විභක්ති පද වාක්‍යයන්හි යොදා පෙන්වන්න.
- එවැනි වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් **පඤ්චමී** විභක්ති ප්‍රත්‍යය හඳුන්වාදෙන්න.
- පුරුෂලිංග අකාරාන්ත ශබ්දයකට එම ප්‍රත්‍යය යොදා **පඤ්චමී** විභක්ති පද සාදාගන්නා අයුරු පෙන්වාදෙන්න.
- එම **පඤ්චමී** විභක්තිපද අර්ථ ගන්වන අයුරු පෙන්වාදෙන්න.
- **පඤ්චමී** විභක්තිපද කිහිපයක් ලබා දී අර්ථ ගැන්වීමට ඉඩ සලස්වන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් **පඤ්චමී** විභක්ති පද වාක්‍යයන්හි යොදා පෙන්වන්න.
- එවැනි වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් **ෂෂ්ඨී** විභක්ති ප්‍රත්‍යය හඳුන්වාදෙන්න.
- පුරුෂලිංග අකාරාන්ත ශබ්දයකට එම ප්‍රත්‍යය යොදා **ෂෂ්ඨී** විභක්ති පද සාදාගන්නා අයුරු පෙන්වාදෙන්න.
- එම **ෂෂ්ඨී** විභක්තිපද අර්ථ ගන්වන අයුරු පෙන්වාදෙන්න.
- **ෂෂ්ඨී** විභක්තිපද කිහිපයක් ලබා දී අර්ථ ගැන්වීමට ඉඩ සලස්වන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් **ෂෂ්ඨී** විභක්ති පද වාක්‍යයන්හි යොදා පෙන්වන්න.
- එවැනි වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- නිර්දිෂ්ට පාඩම ඇසුරින් **සප්තමී** විභක්ති ප්‍රත්‍යය හඳුන්වාදෙන්න.
- පුරුෂලිංග අකාරාන්ත ශබ්දයකට එම ප්‍රත්‍යය යොදා **සප්තමී** විභක්ති පද සාදාගන්නා අයුරු පෙන්වාදෙන්න.
- එම **සප්තමී** විභක්තිපද අර්ථ ගන්වන අයුරු පෙන්වාදෙන්න.
- **සප්තමී** විභක්තිපද කිහිපයක් ලබා දී අර්ථ ගැන්වීමට ඉඩ සලස්වන්න.
- **සප්තමී** විභක්ති පද වාක්‍යයන්හි යොදා පෙන්වන්න.
- එවැනි වාක්‍ය කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- **චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී** විභක්ත්‍යන්ත පදවල අර්ථ ප්‍රකාශ කරයි.
- එම විභක්ති අර්ථ ප්‍රකට වන සේ සරල වාක්‍ය ගොඩනගයි.
- සංස්කෘත වාක්‍යවල අන්තර්ගත එම විභක්ති රූප වෙන් කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකයේ 12 - 15 පාඩම්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත භාෂාව 2 පොත මූලික පිරිවෙන

**06 නිපුණතාව**

නාම වරනැගිලි මතකයෙන් කීමේ හැකියාව ලබාගනියි.

**නිපුණතා මට්ටම**

**6.1** **අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂලිංග** නාම වරනැගිලි නිවැරැදි ව වරනගා මතකයෙන් කියයි.

කාලච්ඡේද 05

**ඉගෙනුම් පල**

- **පුරුෂලිංග ශබ්ද හඳුනා ගන්නා අයුරු පෙන්වා දෙයි.**
- **පුරුෂලිංග ශබ්ද වරනැගීමේ හැකියාව ලබයි.**
- **අන්තය අනුව වරනැගීමේ ඇති වෙනස්කම් හඳුනාගෙන භාවිත කිරීමේ හැකියාව ලබයි.**
- **වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

නාමයකට විවිධ අර්ථ ගැන්වීම් විභක්ති මගින් සිදු කෙරේ. විභක්ති ගැන්වූ නාමයක්, පදයක් වශයෙන් හැඳින්වේ. (විභක්ත්‍යන්තං පදං) සංස්කෘත භාෂාවේ නාම විභක්ති 8 කි. එයින් ආමන්ත්‍රණවාචී සම්බෝධන විභක්තිය ප්‍රථමාවේ ම ප්‍රභේදයක් වශයෙන් සැලකේ. ඒ අනුව සංස්කෘත භාෂාවේ ප්‍රධාන නාම විභක්ති 7 ක් ලෙස දැක්වේ. කරණාර්ථය තෘතීයා විභක්තියෙන් ම ප්‍රකාශිත වේ. නාමයෝ ස්වරයන්ගෙන් අන්ත වෙත් නම් ඒවා **ස්වරාන්ත නාම** ලෙස හැඳින්වේ. ස්වරාන්ත නාම, නාම හා ප්‍රත්‍ය එකතු වීමේ දී සන්ධි වීම් අනුව ඒ ඒ ලිංගයන්ට අදාළ ව අකාරාන්තය, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත ආදී වශයෙන් වරනැගීම් සිදු වේ. හල් අකුරකින් අන්ත වන නාම හලන්ත නාම වන අතර නාම හා ප්‍රත්‍යය එකතු වීමේ දී සන්ධි වීම් අනුව ඒ ඒ ලිංගවලට අදාළ ව වරනැගීම් සිදු වේ. මෙම සියලු වරනැගීම් ඒකවචන, ද්විවචන, බහුවචන වශයෙන් වචනත්‍රයකට ද බෙදේ. සංස්කෘතයේ ලිංග භේදය නිශ්චිත ව ම දැක්විය නොහැකි අතර එය භාෂා භාවිතයෙන් හා ශබ්දකෝෂ පරිශීලනයෙන් දැනගත යුතු වේ. මෙම නිපුණතා මට්ටමේ දී ස්වරාන්ත නාම වරනැගීම් පිළිබඳ ව පමණක් දැනුවත් වීම සෑහේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කුමාර, කවි, ගුරු යන ශබ්ද ඇතුළත් පුරුෂලිංග නාම වරනැගීම් වගුවක් සිසුන් වෙත ලබා දෙන්න.
- වගුවේ එන **කුමාර** ශබ්දය වරනගා පෙන්වන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව කියන්න.
- එම ශබ්දය වෙන් වෙන් ව සිසුන් ලවා හඬ නගා කියවීමට සලස්වන්න.
- වගුවේ දැක්වෙන ඉකාරාන්ත **කවි** ශබ්දය හඬ නගා කියවන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව ශබ්ද නගා කියවන්න.
- එම ශබ්දය තනි තනි ව සිසුන්ට හඬ නගා කියැවීමට ඉඩ සලස්වන්න.
- වගුවේ ඇතුළත් **ගුරු** ශබ්දය වරනගා පෙන්වන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- එම ශබ්දය තනි තනි ව සිසුන්ට හඬ නගා කියැවීමට අවස්ථාව ලබාදෙන්න.
- අන්තය, විභක්තිය, වචනය අනුව ඉහත ශබ්දවල වරනැගීමේ විශේෂතා පෙන්වාදෙන්න.
- එම ශබ්දයන්හි අර්ථ පැහැදිලි කරන්න.
- වගුව ආශ්‍රයෙන් සමාන ශබ්ද හඳුන්වාදෙන්න.
- සමාන ශබ්ද වරනැගීමට පුහුණු කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂලිංග නාමපද නිවැරදි ව මතකයෙන් කියයි.
- සමාන ශබ්ද මතකයෙන් වරනගයි.
- ඒ ඒ ශබ්දවල **විභක්ති, වචන, අර්ථ** අවබෝධයෙන් කියයි.

- अजाय । चोरात् । छात्राणाम् । गजे । अहयः । काकस्य । कपिभिः । भूपतेः । असिना । मुनये । गिर्योः । तरुषु । वायुना । भानोः । बन्धवे । सेतोः යන පදවල විභක්තිය, වචනය තේරුම නිවැරදි ව හඳුනාගෙන ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත පුරුෂලිංග නාමවරනැගීම් වගුවක්
- නාමවරනැගීම් ඇතුළත් DVD තැටියක්.

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
- සංස්කෘත ව්‍යාකරණ තරංගණී - හැගොඩ ධම්මින්ද හිමි.

**06 නිපුණතාව**
නාම වරනැගිලි මතකයෙන් කීමේ හැකියාව ලබාගනියි.

**නිපුණතා මට්ටම**

**6.2 ආකාරාන්ත, ඉකාරාන්ත. උකාරාන්ත ස්ත්‍රීලිංග නාම** වරනැගිලි නිවැරැදි ව වරනගා මතකයෙන් කියයි.

**කාලච්ඡේද 04**

**ඉගෙනුම් පල**

- **ස්ත්‍රීලිංග ශබ්ද හඳුනාගන්නා අයුරු විස්තර කරයි.**
- **ස්ත්‍රීලිංග ශබ්ද වරනැගීමේ හැකියාව ලබයි.**
- **පුරුෂලිංග ශබ්ද හා වරනැගීමේ ඇති වෙනස්කම් පෙන්වා දෙයි.**
- **වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සාමාන්‍යයෙන් ස්ත්‍රී ලක්ෂණ හෙවත් ස්ත්‍රී භාවයන් ප්‍රකට වන ශබ්ද ස්ත්‍රී ලිංගික ශබ්ද වශයෙන් හැඳින්වෙයි. සිංහලයේ මෙන් ම සංස්කෘතයේ ද ලිංග නම් කරනු ලබන්නේ බාහිර වශයෙන් පෙනෙන ශබ්දවල ස්වරූපය අනුව ම නොව වරනැගීමේ විශේෂ ලක්ෂණ මත යි. සංස්කෘතයේ ලිංගභේදය ව්‍යවහාරයෙන් දත යුතු ය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- මාලා, මති, ධෙනු යන ස්ත්‍රීලිංගික ශබ්ද වරනැගීම් වගුවක් සිසුන් වෙත ලබා දෙන්න.
- වගුවේ එන **මාලා** ශබ්දය වරනගා පෙන්වන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව කියන්න.
- එම ශබ්දය වෙන් වෙන් ව සිසුන් ලවා හඬ නගා කියැවීමට සලස්වන්න.
- වගුවේ දැක්වෙන ඉකාරාන්ත **මති** ශබ්දය ශබ්ද නගා කියවන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව ශබ්ද නගා කියවන්න.
- එම ශබ්දය තනි තනි ව සිසුන්ට හඬ නගා කියැවීමට ඉඩ සලස්වන්න.
- වගුවේ ඇතුළත් **ධේනු** ශබ්දය වරනගා පෙන්වන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- එම ශබ්දය තනි තනි ව සිසුන්ට හඬ නගා කියැවීමට අවස්ථාව ලබාදෙන්න.
- අන්තය, විභක්තිය, වචනය අනුව ඉහත ශබ්දවල වරනැගීම් ලක්ෂණ පෙන්වාදෙන්න.
- එම ශබ්දයන්හි අර්ථ පැහැදිලි කරන්න.
- වගුව ආශ්‍රයෙන් සමාන ශබ්ද හඳුන්වාදෙන්න.
- සමාන ශබ්ද වරනැගීමට පුහුණු කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, ස්ත්‍රීලිංග නාමපද නිවැරදි ව ස්මරණයෙන් කියයි.
- සමාන ශබ්ද මතකයෙන් වරනගයි. ඒ ඒ ශබ්දවල **විභක්ති, වචන, අර්ථ** අවබෝධයෙන් කියයි.
- **लतायै । निशायाम् । मालासु । शारिकायाः । शालासु । वनितानाम् । गत्यै । जात्या । द्युत्याः । रात्रिषु । तनुम् । रज्ज्वा । करेणूनाम्** යන පදවල විභක්තිය, වචනය තේරුම නිවැරැදි ව හඳුනාගෙන ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත ස්ත්‍රීලිංගික ශබ්ද වරනැගීම් සහිත වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
- සංස්කෘත ව්‍යාකරණ තරංගණී - හැගොඩ ධම්මින්ද හිමි.

**06 නිපුණතාව**

නාම වරනැගිලි මතකයෙන් කීමේ හැකියාව ලබාගනියි.

**නිපුණතා මට්ටම**

**6.3 අකාරාන්ත නපුංසකලිංග** නාම වරනැගිලි නිවැරැදි ව වරනගා මතකයෙන් කියයි.

**කාලච්ඡේද 02**

**ඉගෙනුම් පල**

- **නපුංසකලිංග ශබ්ද වර්ග කර දක්වයි.**
- **නපුංසකලිංග ශබ්ද වරනැගීමේ හැකියාව ලබයි.**
- **පුරුෂලිංග ශබ්ද මෙන් සමාන ව හා අසමාන ව වරනැගෙන විභක්ති හඳුනාගෙන ලියයි/කියයි.**
- **වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ඵල - ගෘහ යනාදි ශබ්ද නපුංසකලිංගයට අයත් ය. පුරුෂලිංග හා ස්ත්‍රීලිංග ශබ්ද වරනැගීමට වඩා නපුංසකලිංග ශබ්ද වෙනස් ව වරනැගේ. සංස්කෘත භාෂාවේ නපුංසකලිංග ශබ්ද භාෂාව ප්‍රගුණ කිරීමෙන් ම හඳුනාගත යුතු ය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- අකාරාන්ත නපුංසක ලිංගික **ඵල** ශබ්දය ඇතුළත් වගුවක් සිසුන් වෙත ලබා දෙන්න.
- වගුවේ ඇතුළත් **ඵල** ශබ්දය හඬ නගා කියවන්න.
- එම ශබ්දය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- එම ශබ්දය වෙන් වෙන් ව සිසුන්ට හඬ නගා කියැවීමට අවස්ථාව ලබාදෙන්න.
- අනෙකුත් අකාරාන්ත නපුංසකලිංග ශබ්ද ඒ අනුව වරනැගෙන බව පෙන්වාදෙන්න.
- අකාරාන්ත පුරුෂලිංග ශබ්ද හා අකාරාන්ත නපුංසකලිංග ශබ්ද වරනැගීමේ දී ඇති සමාන - අසමානතා හඳුන්වා දෙන්න.
- එම **ඵල** ශබ්දයේ අර්ථය පැහැදිලි කරදෙන්න.
- **ඵල** ශබ්දය හා සමාන ශබ්ද හඳුන්වා දෙන්න.
- සමාන ශබ්ද වරනැගීමට පුහුණු කරවන්න.
- නපුංසකලිංග අකාරාන්ත ශබ්දයක් මතකයෙන් වරනගන්නට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- **ඵල** ශබ්දය හඬ නගා මතකයෙන් කියයි.
- **ඵල** ශබ්දය හා සමාන ශබ්ද වරනගයි.
- සමාන නාමපද කිහිපයක විභක්ති, වචන, අර්ථ ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- අකාරාන්ත නපුංසකලිංග **ඵල** ශබ්දය ඇතුළත් වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
- සංස්කෘත ව්‍යාකරණ තරංගණී - හැගොඩ ධම්මින්ද හිමි.

**07 නිපුණතාව**

නිර්දිෂ්ට ග්‍රන්ථ හඬ නගා නිවැරැදි ව කියැවීම, දේවනාගරී අක්ෂරයෙන් ලිවීම, වනපොත් කිරීම, අර්ථ විවරණය කිරීම පිළිබඳ ව හැකියාව ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

**7.1** බුද්ධගද්‍යය, නාමාෂ්ටශතකය, ව්‍යාසකාරය යන සරල සංස්කෘත ග්‍රන්ථ මැනවින් කියවයි.
7.2 එම ග්‍රන්ථ ළයාන්විත ව සජ්ඣායනය කරයි.
7.3 ව්‍යාසකාරයේ අන්තර්ගත ශ්ලෝකවලින් තෝරාගත් කොටස් මතකයෙන් කියයි.
7.4 තෝරාගත් ශ්ලෝක නිවැරැදි ව දේවනාගරී අක්ෂරයෙන් ලියයි.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- **සරල සංස්කෘත කෘති තනි ව අධ්‍යයනය කිරීමේ හැකියාව ලබයි.**
- **සරල සංස්කෘත ශ්ලෝක ගායනය කිරීමේ හැකියාව ලබයි.**
- **සඳුපදේශ භාවිතයට ගැනීමේ හැකියාව ලබයි.**
- **දේවනාගරී අක්ෂර භාවිතයෙන් ශ්ලෝක ලියා දක්වයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මෙම නිපුණතාවෙන් අපේක්ෂා කෙරෙන්නේ සම්භාව්‍ය සංස්කෘත ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හැකියාව දියුණු කිරීම යි. ඒ අනුව නාමාෂ්ටශතකයේ මුල් ශ්ලෝක පහ සහ බුද්ධ ගද්‍යයේ මුල් ශ්ලෝක පහට අවධානය යොමු කරමින් තාලයකට හඬනගා කියැවීමට යොමු කැරැවීම, සංයුක්තාක්ෂර හැඳිනගැනීම, වේගවත් ව කීමේ හැකියාව ඇති කරවීම යන කරුණු සිසුන් තුළ ගොඩනැංවීම අපේක්ෂා කෙරේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නාමාෂ්ටශතකයේ මුල් ශ්ලෝක පහක් ද, බුද්ධගද්‍යයේ මුල් ශ්ලෝක පහක් ද, ව්‍යාසකාරයේ තෝරාගත් ශ්ලෝක පහක් ද සිසුන්ගේ අවධානයට යොමු කරන්න.
- පළමුව ශ්ලෝක පඞ්ක්ති බැඳි අකුරු හා මහප්‍රාණ නිසි ලෙස උච්චාරණය කරමින් හඬ නගා කියවන්න.
- ඒවා නැවත නැවතත් සිසුන් හා සාමූහික ව හඬ නගා කියවා නිවැරැදි උච්චාරණයට හුරු කරවන්න.
- එම ශ්ලෝක පඞ්ක්ති ළයාන්විත ව හඬ නගා ගායනය කර පෙන්වන්න.
- සිසුන්ට උච්චාරණයට හුරු කරවන ලද ශ්ලෝක පඞ්ක්ති නැවත නැවතත් සාමූහික ගායනයට ලක් කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා වෙන් වෙන් ව ශ්ලෝක පඞ්ක්ති ගායනයට ඉඩ සලස්වන්න.
- එක් එක් ශිෂ්‍යයාට වෙන වෙන ම ගායනයට ද අවස්ථාව ලබා දෙන්න.
- ගායනය තුළින් එම ශ්ලෝක පඞ්ක්ති වාචෝද්ගත කිරීමට උනන්දු කරවන්න.
- එම ශ්ලෝක නිවැරැදි ව කලුලෑල්ලේ **මාතෘ භාෂාවේ අකුරින්** ලියා පෙන්වන්න.
- එවා සිසුන්ගේ අභ්‍යාස පොත්වල **දේවනාගරී අකුරෙන්** ලිවීමට උපදෙස් දෙන්න.
- එම ශ්ලෝකවල අර්ථ පැහැදිලි කරදෙන්න.
- ඒ තුළින් බුද්ධගද්‍යය, නාමාෂ්ටශතකය, ව්‍යාසකාරය ආදි සංස්කෘත ග්‍රන්ථ කියැවීමට සිසුන් උනන්දු කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- නාමාෂ්ටශතකය, බුද්ධගද්‍යය හා ව්‍යාසකාරය යන කෘතිවලින් තෝරාගත් ශ්ලෝක කිහිපයක් ගායනය කරයි.
- එම ශ්ලෝකවල බැඳි අකුරු නිවැරැදි ව උච්චාරණය කරයි.
- එබඳු ශ්ලෝක වෙනත් කෘතිවලින් සොයා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නාමාෂ්ටශතකය මුල් ශ්ලෝක 05
- බුද්ධගද්‍යයේ මුල් ශ්ලෝක 05
- ව්‍යාසකාරයේ 03, 07, 13, 27, 32, 53 යන ශ්ලෝක 06

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - ජයදේව තිලකසිරි

**08 නිපුණතාව**

සංස්කෘත උපදේශ සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ හා සාහිත්‍ය රස වින්දනයෙහි යෙදීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

8.1 හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය යන ග්‍රන්ථ පිළිබඳ සරල දැනුමක් ලබාගනියි.

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- **උපදේශ සාහිත්‍යය පිළිබඳ අවබෝධය ලබයි.**
- **සංස්කෘත උපදේශ සාහිත්‍යය හඳුනාගෙන විස්තර කරයි.**
- **හිතෝපදේශය ආශ්‍රිත උපදේශ උගනියි.**
- **පඤ්චතන්ත්‍රය ආශ්‍රිත උපදේශ උගනියි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

උපදේශ සාහිත්‍යය සංස්කෘත සාහිත්‍යයේ විශේෂ තැනක් ගනියි. සත්ත්ව සහ මිනිස් චරිත යොදාගනිමින් ගොතනු ලැබූ කථා මගින් කිසියම් ජීවිතාවබෝධයක් ලබාදීම උපදේශ සාහිත්‍යයෙන් සිදු කෙරෙයි. ප්‍රධාන කතාවට අමතර ව අතුරු කථා එක් කරමින් රසවත් සාහිත්‍යයෙන් ඉදිරිපත් කරන අතර මිනිස් ජීවිතවල දුබලතා සත්ත්ව චර්යා මගින් විවේචනයට භාජන කරයි. යහ චරිත මතු කරමින් සදාචාරය ඉස්මතු කිරීමට වෙර දරයි. ගද්‍යයෙන් කථාව ඉදිරිපත් කැරෙන අතර පද්‍ය විශාල සංඛ්‍යාවක් අන්තර්ගත වේ. එකී පද්‍ය එක්කෝ උපදේශයක් මතු කිරීමට, කථාවේ හරය ගෙනහැර පෑමට නැතහොත් සාරාංශ ඉදිරිපත් කිරීමට පමණක් යොදාගෙන ඇත.

## සංස්කෘත උපදේශ කථා සාහිත්‍යය

උපදෙස් දීම ඕනෑම සමාජයක පැවත එන්නකි. ප්‍රත්‍යක්ෂයෙන් ලැබූ අද්දැකීම් සම්භාරයක් ජනශ්‍රැති , ජනප්‍රවාද හා විවිධ සාහිත්‍ය පරිශීලනයෙන් තනාගත් උපදේශාත්මක කථා කලින් කල එක් වීමෙන් විශාල උපදේශ කථා සාහිත්‍යයක් සංස්කාත සාහිත්‍යයෙහි ගොඩනැගී ඇත.

උපදේශ කථා සාහිත්‍ය ඉතිහාසය සොයන්නකුට හමු වන පැරණිතම උපදේශාත්මක පද්‍ය දක්නට ලැබෙන්නේ ඍග්වේදයෙහි ය. සූදුකාරයන්ගේ ගීතය නමින් ප්‍රකට ( Gambler ) දූ කෙළියෙහි ආදීනව දක්වෙන X මණ්ඩලයේ 34 වන සූක්තය ඉතා වැදගත් වේ.

1.2.1 උපනිෂද් සාහිත්‍යයෙහි එන කඨෝපනිෂදයෙහි 1.11.1 හි සඳහන් උපදේශාත්මක උපනිෂද් පාඨ උපදේශාත්මක වශයෙන් ඉතා වැදගත් වේ. ප්‍රිය දේ පතන්නේ පරම පුරුෂාර්ථ විසින් පිරිහෙන බව එහි අවධාරණ කරයි.

කුඩා කුඩා උපදේශ සංග්‍රහයන් ලෙස ප්‍රකට ව්‍යාසකාරය, නීතිශතකය වැනි කෘතිවල වෙන් වෙන් ව ගත හැකි උපදේශ රාශියක් දක්නට ලැබේ.

කලක් තිස්සේ පැවති උපදෙස් දීමේ උනන්දුව නිසා සත්ත්ව ජීවිත සමග මනුෂ්‍ය ජීවිත යා කරමින් මනුෂ්‍යයන් ගේ දුබලතා ඍජු ව විවේචනය කිරීම වෙනුවට සත්ත්ව චරිත හා මුසු කොට එය සිදු කිරීමට ගත් උත්සාහයක් උපදේශ කතා සාහිත්‍යයෙන් පෙනේ. යහ ගුණ කීර්තනය කිරීම සඳහා ද සදාචාරය ඇගයීම සඳහා ද සත්ත්ව හා මනුෂ්‍ය චරිත උපයෝගී කරගත් අයුරු දැක්වීමට පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය යන උපදේශ කෘති දෙකෙන් ම හෝ කරුණු සපයාගත හැකි ය.

| | පඤ්චතන්ත්‍රය | | හිතෝපදේශය |
|---|---|---|---|
| 01 | කර්තෘ - විෂ්ණු ශර්මන් | 01 | කර්තෘ - නාරායණ පණ්ඩිත |
| 02 | කාලය - ක්‍රි.ව. 4 - 5 සියවස | 02 | කාලය - ක්‍රි.ව. 10 - 11 සියවස් අතර කාලය |
| 03 | පැරණි සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් | 03 | පඤ්චතන්ත්‍රය ඇතුළු වෙනත් කෘතිවලින් කරුණු ගෙන රචනා කොට ඇත. (පඤ්චතන්ත්‍රාත් තථාන්‍යස්මාද් ග්‍රන්ථාදාකෘෂ්‍ය ලිඛ්‍යතේ ) |
| 04 | පඤ්චතන්ත්‍රයේ තන්ත්‍ර 5 කි<br>1. මිත්‍රභේද<br>2. මිත්‍ර සම්ප්‍රාප්ති<br>3. කාකොලූකීය<br>4. ලබ්ධප්‍රණාශ<br>5. අපරීක්ෂිතකාරක | 04 | හිතෝපදේශයේ තන්ත්‍ර 4 කි.<br>1. මිත්‍රලාභ<br>2. සුහෘද්භේද<br>3. විග්‍රහ<br>4. සන්ධි |

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ඉහත විස්තරය ඇසුරින් උපදේශ කථා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ සිසුන්ට පැහැදිලි අවබෝධයක් ලබාදෙන්න.
- උපදේශ සාහිත්‍ය පිළිබද සාමාන්‍ය දැනුමක් ලබාදීම සඳහා සිසුන් සමග සාකච්ඡාවක් පවත්වන්න.
- පඤ්චතන්ත්‍රය පිළිබඳ සරල හැඳින්වීමක් කරන්න.
- පඤ්චතන්ත්‍රයේ ඇති උපදේශාත්මක අගය විමසීමට ලක් කරන්න.
- හිතෝපදේශය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- හිතෝපදේශය පඤ්චතන්ත්‍රයෙන් ලද ආභාසය පිළිබඳ විග්‍රහයක් කරන්න.
- හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රයෙන් ලද හැකි ජීවිතාදර්ශ පිළිබඳ හඳුන්වා දෙන්න.
- හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රය ආශ්‍රයෙන් අධ්‍යාපනයේ වටිනාකම දැක්වෙන සදුපදේශ කිහිපයක් පෙන්වා දෙන්න.
- එම උපදේශ සාහිත්‍යය මගින් ජීවිතයට ලද හැකි ආදර්ශ චරිතායනය කළ බවට දෙන ලද ප්‍රශ්නාවලියක් මගින් පරීක්ෂා කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උපදේශ සාහිත්‍යය පිළිබඳ ව හැඳින්වීමක් කරයි.
- හිතෝපදේශයේ හා පඤ්චතන්ත්‍රයේ අන්තර්ගතය පිළිබද ව විස්තර කරයි.
- හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය සදුපදේශ ග්‍රන්ථ බව ප්‍රකාශ කරයි.
- හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය වැනි ග්‍රන්ථ කියැවීමට උනන්දුවක් ඇති බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- හිතෝපදේශය
- පඤ්චතන්ත්‍රය

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - ජයදේව තිලකසිරි
- සංස්කෘත ගද්‍ය පද්‍යාවලී -ප්‍රාචීන අධ්‍යාපන ආයතනය

**08 නිපුණතාව**

සංස්කෘත උපදේශ සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ හා සාහිත්‍යය රස වින්දනයෙහි යෙදීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

8.2 හිතෝපදේශය පඤ්චතන්ත්‍රය යන උපදේශ ග්‍රන්ථවලින් තෝරාගත් කොටස් කියවා රස වින්දනයෙහි යෙදෙයි.

**කාලච්ඡේද 04**

**ඉගෙනුම් පල**

- **පඤ්චතන්ත්‍රයේ සහ හිතෝපදේශයේ අන්තර්ගත ගද්‍ය පද්‍ය පාඨ නිවැරැදි ව ශබ්දනගා කියවයි.**
- **එම පාඨ මාධ්‍ය භාෂාවට නිවැරදි ව පරිවර්තනය කරයි.**
- **පඤ්චතන්ත්‍රය සහ හිතෝපදේශය ආශ්‍රයෙන් සාහිත්‍ය රස වින්දනය කරයි.**

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-** පඤ්චතන්ත්‍රය සහ හිතෝපදේශයේ දී ඇති පාඨ ආශ්‍රයෙන් භාෂා කුශලතාව පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා කරගැනීම අපේක්ෂිත යි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- හිතෝපදේශය - මිත්‍රලාභ කාණ්ඩයේ දෙවන කථාව (මුව, කවුඩු හා ක්ෂුද්‍රබුද්ධි නම් නරියාගේ කථාව) සිසුන්ට ලබා දෙන්න.
- එම හිතෝපදේශ පාඨය නිවැරදි ව ශබ්ද නගා කියවන්න.
- නැවත එය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- හිතෝපදේශ පාඨය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර පෙන්වන්න.
- එය ආශ්‍රයෙන් සාහිත්‍ය රස වින්දනයේ යෙදෙන්න.
- සිසුන්ට දුෂ්කර වචන ලියාගන්නට සලස්වන්න.
- සිසුන්ට එම පාඨය පරිවර්තනය කිරීමට ඉඩ සලස්වන්න.
- පඤ්චතන්ත්‍රය - මිත්‍රභේදයේ පළමු කථාව 21, 22 ශ්ලෝක ද ඇතුළත් ව (කුඤ්ඤය ගැලවූ වඳුරාගේ කථාව) සිසුන්ට ලබා දෙන්න.
- එහි අන්තර්ගත පඤ්චතන්ත්‍ර පාඨය නිවැරදි ව ශබ්ද නගා කියවන්න.
- නැවත එය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- පඤ්චතන්ත්‍ර පාඨය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර පෙන්වන්න.
- එය ආශ්‍රයෙන් සාහිත්‍ය රස වින්දනයේ යෙදෙන්න.
- එම පාඨයේ ඇති දුෂ්කර වචන ලියාගන්නට සලස්වන්න.
- සිසුන්ට එම පාඨය පරිවර්තනය කිරීමට උදව් වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ දී ඇති කොටසක් ශබ්ද නගා නිවැරදි ව කියවයි.
- දී ඇති කොටසින් තෝරාගත් සංස්කෘත වචන කිහිපයක පදගතාර්ථ කියයි.
- සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ ඇති වැදගත්කම සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- හිතෝපදේශය - මිත්‍රලාභ කාණ්ඩයේ දෙවන කථාව (මුව, කවුඩු හා ක්ෂුද්‍රබුද්ධි නම් නරියාගේ කථාව)
- පඤ්චතන්ත්‍රය - මිත්‍රභේදයේ පළමු කථාව 21, 22 ශ්ලෝක ද ඇතුළත් ව (කුඤ්ඤය ගැලවූ වඳුරාගේ කථාව)

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - ජයදේව තිලකසිරි

# තක්සේරුව හා ඇගයීම

# හැඳින්වීම

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස ගුරු මහත්ම මහත්මීන් සිසුන් ලබා සිටින ප්‍රාප්ති මට්ටම් සහ ඔවුන් මුහුණ පා සිටින ඉගෙනුම් දුෂ්කරතාවන් පිළිබඳ සුවිශේෂී ලෙස අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍ය ය. එය එක් එක් ශිෂ්‍යයා හට ගැලපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම පුළුල් අරමුණෙන් යුතු ව පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යනුවෙන් සරල ව හඳුන්වා දිය හැකි ය.

තක්සේරු කිරීමේ විවිධ භාවිතයන් ඇත. තේරීම් කාර්යය, ස්ථාපන කාර්යය, පර්යේෂණ කාර්යය ඒ අතරින් ප්‍රධාන ය. පන්ති කාමරය තුළ ගුරුවරයකුට සිසුන්ගේ ඉගෙනුම් ගැටලු අනාවරණය කරගෙන අපේක්ෂිත ඉගෙනුම් මට්ටම් කරා සිසුන් නියාමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම ප්‍රයෝජනවත් වේ. තක්සේරු කිරීම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුත්තේ එම පුළුල් අරමුණෙන් යුතු ව ය.

පන්ති කාමරය තුළ කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දෙයාකාරයකට ක්‍රියාත්මක කළ හැකි ය. එනම් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගැනුම් අඛණ්ඩ ලෙස 'සම්භවන' ආකාරයට ක්‍රියාත්මක කිරීම සහ වසරක්, වාරයක්, පාඩම් ඒකකයක්, තේමාවක් 'සම්පිණ්ඩිත' ආකාරයට තක්සේරු කිරීමත් ය. මෙම ගුරු අත්පොතේ සෑම ඉගෙනුම් නිපුණතා මට්ටමක් අවසානයේ ම එම පාඩමින් සිසුන් විසින් සංවර්ධනය කරගත යුතු කුශලතා සැලකිල්ලට ගෙන තක්සේරු කිරීමේ නිර්ණායක ඉදිරිපත් කර ඇත. පහත දැක්වෙන්නේ ඒ සඳහා උදාහරණයකි.

**නිපුණතා මට්ටම**

**6.1 අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂලිංග නාම** වරනැගිලි නිවැරදි ව වරනගා මතකයෙන් කියයි.

**තක්සේරුව හා ඇගයීම**

- අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂලිංග නාමපද නිවැරදි ව මතකයෙන් කියයි.
- සමාන ශබ්ද මතකයෙන් වරනගයි.
- ඒ ඒ ශබ්දවල **විභක්ති, වචන, අර්ථ** අවබෝධයෙන් කියයි.
- **अजाय । चोरात् । छात्राणाम् । गजे । अहयः । काकस्य । कपिभिः । भूपतेः । असिना । मुनये । गिर्योः । तरुषु । वायुना । भानोः । बन्धवे । सेतोः** යන පදවල විභක්තිය, වචනය තේරුම නිවැරදි ව හඳුනාගෙන ලියයි.

පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතර තුර මෙම ඉගෙනුම් මට්ටම් කරා සිසුන් පැමිණ තිබේ ද?. නැතහොත් ඔවුන් දුෂ්කරතාවන් පෙන්නුම් කරන්නේ ද? යන්න හඳුනාගනිමින් කටයුතු කිරීමට ගුරුවරයකුට පුළුවන. මෙවැනි සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියක දී ගුරුවරයකුට සිසුන් හඳුනාගැනීම පිණිස, සිසුන්ගේ වැඩ නිරීක්ෂණය කිරීම හා සිසුන් සමග සාකච්ඡා කිරීම වැනි අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රම භාවිතයට ගත හැකි ය. එයට අමතර ව රචනා ලියවීම පෙළ පොතේ අභ්‍යාසවලට දෙන පිළිතුරු ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමවේදයන් ද භාවිතයට ගත හැකි ය. එසේ ම දෙවනුවට සඳහන් කළ සම්පිණ්ඩිත තක්සේරු කිරීම සඳහා මාසයක්, වාරයක්, අවුරුද්දක් අවසානයේ පවත්වන පරීක්ෂණ හෝ මෙම ගුරු අත්පොතෙන් ඉදිරිපත් කොට ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරකය නිදර්ශකයක් ලෙස භාවිත කරමින් සකස් කරගන්නා ආධාරක යොදා ගත හැකි ය.

සිසුන් තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ යොදාගන්නා විට තමා විසින් ම සකස් කරගනු ලබන පරීක්ෂණ උපයෝගී කරගන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත. පන්ති කාමරය තුළ කරන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස වඩාත් වලංගුතාවකින් යුක්ත වන්නේ අදාළ ගුරුවරුන් විසින් සකස් කරගනු ලබන පරීක්ෂණ ය. ගුරු මහත්ම මහත්මීන් ඒ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුශලතා වර්ධනය කරගත යුතු ය.

මෙම පසුබිම යටතේ පන්ති කාමරය තුළ කෙරෙන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සිසුන් හොඳින් හඳුනාගෙන එක් එක් සිසුවාට ගැලපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් ලබා දී අපේක්ෂිත ඉගෙනුම් ඵල කරා ඔවුන් නියාමනය කිරීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන ක්‍රියාත්මක විය යුතු ය.

එක් එක් නිපුණතා මට්ටමකට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනු පිළිවෙළ සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ එක් ආධාරකයක් නිදර්ශකයක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ඉදිරිපත් කොට ඇත. එය අනුසාරයෙන් ඒ ඒ වාරවලට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක ගුරුවරයා විසින් ම උචිත පරිදි සකස් කර ගත යුතු ය.

**ඒ ඒ වාර සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු අනුපිළිවෙළ (නිපුණතා මට්ටම් අනුව)**

| වාරය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු නිපුණතා මට්ටම්වල අනුපිළිවෙළ | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක | | |
|---|---|---|---|---|
| | | 1 වැනි ඇගැයීම් අවස්ථාව | 2 වැනි ඇගැයීම් අවස්ථාව | 3 වැනි ඇගැයීම් අවස්ථාව |
| 1 වාරය | 1.1<br>1.2<br>1.3<br>1.4<br>1.5<br>2.1<br>2.2<br>2.3<br>3.1<br>3.2<br>3.3<br>3.4 | 1.1<br>1.2<br>1.3<br>1.4<br>1.5 | 2.1<br>2.2<br>2.3 | 3.1<br>3.2<br>3.3 |
| 2 වාරය | 3.4<br>3.5<br>4.1<br>4.2<br>4.3<br>5.1<br>5.2<br>5.3 | 3.4<br>3.5 | 4.1<br>4.2<br>4.3 | 5.1<br>5.2<br>5.3 |

| | | | | |
|---|---|---|---|---|
| 3 වාරය | 5.3<br>6.1<br>6.2<br>6.3<br>7.1<br>7.2<br>7.3<br>7.4<br>8.1<br>8.2 | 6.1<br>6.2<br>6.3 | 7.1<br>7.2<br>7.3<br>7.4 | 8.1<br>8.2 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය :- දෙවැනි වාරය

2. ආධාරක අංකය. :- 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්. :- 3.1, 3.2, 3.3, 3.4 5.1 5.2, 5.3,

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය. :-

- සරල සංස්කෘත ශික්ෂකය 1 කොටස (අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රීය නාහිමි) ග්‍රන්ථයේ 01 සිට 15 දක්වා පාඩම්වල අභ්‍යාස කරවීම.
- සංවෘත ඡේදයක් පරිවර්තනය කිරීමේ හැකියාව

5. ආධාරකයේ ස්වභාවය :- තෝරාගත් නිර්දිෂ්ට කෘතියක ඡේදයක් නාගරී අකුරෙන් ලියා පරිවර්තනය කිරීම හා ව්‍යාකරණ විභාග දැක්වීම.

6. ආධාරකයේ අරමුණු. :-

- පැහැදිලි අත් අකුරෙන් සංස්කෘත ඡේදයක් පිටපත් කිරීම.
- සංස්කෘතයෙන් සිංහලයට පරිවර්තනය කිරීමේ හැකියාව ලබාදීම.
- ආඛ්‍යාත පදවල ලකාර, පුරුෂ, වචන භේදය හඳුනාගැනීම.
- නාමපදවල විභක්ති හා විභක්ත අර්ථය හඳුනාගැනීම.

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.

ගුරු උපදෙස් :

- සුදුසු සංවෘත ඡේදයක් සිසුන්ට ලබා දෙන්න
- සපයා ඇති ආධාරකයේ නිර්ණායක සිසුන්ට පැහැදිලි කර දී ඒ අනුව ලකුණු ලැබෙන බව කියන්න.

- උගන්වන ලද ලකාර කිහිපයක ආඛ්‍යාත පද ඇතුළත් සංස්කෘත ඡේදයක් සිසුන්ට ලබා දෙන්න.
- අදාළ නිර්ණායකවලට අනුකූල ව සිසුන්ගේ අභ්‍යාසවලට ලකුණු ලබා දෙන්න.

**සිසු උපදෙස්**

- ඔබ වෙත සපයා ඇති සංස්කෘත ඡේදය හොඳින් කියවන්න.
- පැහැදිලි සංස්කෘත අත් අකුරින් එය පිටපත් කරන්න.
- එහි එන වර්තමාන කාල උක්ත ආඛ්‍යාත වෙන් කර දක්වන්න.
- විභක්ති හතෙහි රූප වෙනස් වන අයුරු දක්වන්න.
- ලකාරවල ආඛ්‍යාත වෙන් කර පෙන්වන්න.
- වාක්‍ය පරිවර්තනය කරන්න.

8. ඇගයීම් ක්‍රමය.

| නිර්ණායක / සිසුන්ගේ නම් | නාගරී අත් අකුරු පැහැදිලි ව හා ක්‍රමානුකූල ව ලියයි | විභක්තිගතපද වල විභක්ති හඳුනාගෙන ලියයි. | ලකාරයන්ට අදාළ ආඛ්‍යාත පද වෙන් කරයි. | සංස්කෘත වචනවලට නිවැරදි සිහල තේරුම ලියයි. | අර්ථාන්විත ව සිංහල පරිවර්තනයේ උක්තාඛ්‍යාත ගලපයි. | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳ යි 04
- හොඳ යි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු යි 01